// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2188/13 - 2020 අගෝස්තු මස 10 වැනි සඳුදා - 2020.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/21/03/2008(A).

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.10.09 දිනැති හා අංක 1831/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.10.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 03, 22 වන පටුමග, අංක 03 හි පදිංචි ලංකා වෙළෙඳ කාර්මික හා පොදු කම්කරු සංගමය (C.M.U.) සහ මහරගම, නාවින්න, හයිලෙවල් පාර, අංක 310 හි පිහිටි රිච්ඩ් පීරිස් එක්ස්පෝර්ට්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.02.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජූලි මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A - G 32638 — 31 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය - IR/21/03/2008(A)

**කාර්මික අධිකරණයේ දී ය**

ලංකා වෙළඳ කාර්මික හා පොදු කම්කරු සංගමය (C.M.U),
අංක 03, 22 වන පටුමග,
කොළඹ 03.

*පළමු පාර්ශ්වය.*

නඩු අංකය : A 3524

*සහ*

රිචඩ් පීරිස් එක්ස්පෝර්ට්ස් ලිමිටඩ්,
අංක 310, හයිලෙවල් පාර,
නාවින්න,
මහරගම.

*දෙවන පාර්ශ්වය.*

අතර පවතින ආරවුල.

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධනය වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2013.09.23 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**බේරුම්කරණ විභාගයේ පසුබිම, පෙනී සිටීම සහ එය පැවැත් වූ ආකාරය**

2013.10.23 දිනැති නියෝගය මගින් කම්කරු සහ කම්කරු සබඳතා ඇමතිවරයා විසින් මෙම කාර්මික ආරවුල බේරුම්කරණයෙන් විසඳීමට අංක IR/21/03/2008(A) දරන යොමුව යටතේ මා වෙත යොමු කර ඇති කාර්මික ආරාවුලට සම්බන්ධ කාරණය වන්නේ,

*"රිචඩ් පීරිස් එක්ස්පෝර්ට්ස් ලිමිටඩ් විසින් මෙයට අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් සේවකයන් එකසිය පනස් නව (159) දෙනෙකුගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත ද යන්න සහ යුක්ති සහගත නොවන්නේ නම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ."*

මෙම කාර්මික ආරවුල බේරුම්කරණයෙන් විසඳීම සඳහා මීට පෙර, මෙම කාර්මික අධිකරණයේ බේරුම්කරු ටී. පියසෝම මහතා වෙත කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් යොමු කරනු ලැබ ඇත. එම පත් කිරීම බලරහිත කරන ලෙස රිට් ආඥාවක් ඉල්ලා මෙහි දෙවන පාර්ශ්වයේ සේවායෝජක ආයතනය විසින් අභියාචනාධිකරණයේ අංක 611/09 දරන නඩුව පවරා ඇත. එකී ඉල්ලුම්පත සළකා බැලූ අභියාචනාධිකරණය එකී බේරුම්කරණ විභාගය පැවැත්වීමට ටී. පියසෝම මහතා වෙත කර තිබුණු පත්කිරීම නිශ්ප්‍රභා කරන ලෙස නියෝග කර ඇත. එකී රිට් ආඥාව දෙවන පාර්ශ්වය විසින් ගොනුකර ඇති අවසන් ලිඛිත සැළකිරීම්වල "ඒ" ඇමුණුම වශයෙන් ඇතුළත් කර ඉදිරිපත් කර ඇත. එම කාර්මික ආරවුල බේරුම්කරණයෙන් විසඳීමට අංක IR/21/03/2008(A) දරන යොමුව යටතේ මා වෙත යොමු කරනු ලැබ ඇත්තේ ඉන් පසුව ය.

මෙම බේරුම්කරණ විභාගය සම්බන්ධයෙන් පළමු සහ දෙවන ප්‍රකාශ දෙපාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු 2013.10.29, 2013.11.15, 2013.12.17, 2014.01.31, 2014.02.18, 2014.04.22, 2014.05.22, 2014.06.06, 2014.06.20, 2014.07.01, 2014.07.14. 2014.09.11, 2014.10.14, 2014.10.28, 2014.11.10, 2015.01.20, 2015.01.27, 2015.03.04, 2015.03.31, 2015.04.29, 2015.05.07, 2015.06.08, 2015.06.17, 2015.06.29, 2015.07.09, 2015.08.25, 2015.08.31, 2015.11.13, 2015.11.17, 2015.12.03, 2015.12.18, 2016.01.19, 2016.03.02, 2016.04.29, 2016.05.20, 2016.06.17, 2016.08.09, 2016.08.30, 2016.09.22, 2016.09.29, 2016.11.02, 2016.12.05, 2017.01.26, 2017.03.07, 2017.04.28, 2017.05.22, 2017.06.01, 2017.09.08, 2017.10.02, 2017.10.23, 2018.03.06, 2018.04.06, 2018.05.10, 2018.05.17, 2018.07.17, 2018.08.01 යන දිනයන් හි දී මා විසින් බේරුම්කරණ විභාගය පවත්වා අවසන් කර ඇත. පරීක්ෂණය සඳහා දින නියම කරනු ලැබූ දිනයන් කීපයක දී විවිධ හේතූන් නිසා බේරුම්කරණ විභාගය පැවැත්වීමට නොහැකි වූ බව ද සටහන් කරමි.

සේවය අහිමි කරනු ලැබුවේ යයි කියන සේවකයින් 159 දෙනෙකු නියෝජනය කරන ලංකා වෙළඳ කාර්මික හා පොදු කම්කරු සංගමය (CMU) නමැති වෘත්තිය සමිතිය වෙනුවෙන් පරීක්ෂණය පුරාවටම නීතිඥ සාලිය එදිරිසිංහ මහතා පෙනී සිටි අතර, දෙවන

පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් නීතිඥ කෞෂල්‍යා මොල්ලිගොඩ මහත්මිය සහ නීතිඥ ගිම්හානා වික්‍රමසුරේන්ද්‍ර මහත්මිය සමග ජනාධිපති නීතිඥ ජෙෆ්රි අලගරත්නම් මහතා පෙනී සිටියේ ය. එක් දිනක් දෙවන පාර්ශ්වය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥ චන්ද්‍ර ගමගේ මහතා පෙනී සිටියේ ය. තව ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මණ්ඩලයේ සංයුතිය විභාගය පැවැත්වුණු ඇතැම් දිනවල දී වෙනස් ව පැවති බව ද සටහන් කරමි.

වසර පහකට ආසන්න කාලයක් තුළ දිව ගිය මෙම බේරුම්කරණ විභාගය නිරන්තරයෙන් ම, සියුම් නීති තර්ක, මූලික විරෝධතා, ලකුණු කරන ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත් කිරීමේ ව්‍යායාමයන් ඇතුළු හබ කිරීම්වලින් ගහන වූවකි. ඇතැම් විභාග දිනයන් මෙබඳු හබ කිරීම් වලින් ම අවසන් වූ බව සඳහන් කළ හැකි ය. අවසානයේ දී මා වෙත ලැබුණු ලිපිගොනුවේ පිටු ගණන 1342කි. ලකුණු කළ ලේඛන හැර, ඉංග්‍රීසි භාෂාවෙන් පළමුවන පර්ශ්වය ඉදිරිපත් කළ අවසන් ලිඛිත සැලකිරීම පිටු 22කින් යුක්ත වූ අතර දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළ අවසන් ලිඛිත සැළකිරීම පිටු 44කින් යුක්ත වෙයි. පරීක්ෂණ දිනයන් විශාල සංඛ්‍යාවක දී මෙහෙයවන ලද සාක්ෂි සටහන් ද, එකී අවසන් ලිඛිත සැලකිරීම් සහ ඇමුණුම් ද ලකුණු කර ඉදිරිපත් කළ ලේඛන විශාල සංඛ්‍යාවක් ද, පරීක්ෂණය අතරතුර ඉදිරිපත් වූ මූලික විරෝධතාවන් සම්බන්ධයෙන් යොමු කළ විවිධ ලිඛිත සැළකිරීම් ආදී ලියවිලි ද පරිශීලනය කරමින් මෙම වාර්තාව සකස් කිරීම මහත් වෙහෙසකර කාර්යයක් විය. මෙම අසාමාන්‍ය බේරුම්කරණ විභාගය සමස්තයක් ලෙස ගත් කළ උපරිමාධිකරණයක විභාගවන බැරෑරුම් නඩු විභාගයක ස්වරූපයක් ගත්තේ ය. දෙපාර්ශ්වය නියෝජනය කළ ජ්‍යෙෂ්ඨ නීතිඥවරු අත් නොහැර කළ හබ කිරීම් බෙහෙවින් තියුණු විය. මාගේ විදේශගතවීම්, අධික කටයුතු සහ සෞඛ්‍ය ගැටළු වැනි නොයෙකුත් හේතූන් නිසා මෙම ප්‍රදානය සකස් කිරීම පමා වූ අතර එම පමාව නිසා පාර්ශ්වකරුවන්ට අපහසුවක් සිදු වුනි නම් කණගාටු වෙමි.

මෙම බේරුම්කරණ විභාගයේ දී හබයකින් තොර ව දෙවන පාර්ශ්වයවන සේවායෝජක ආයතනය නියෝජනය කරමින් සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර එකී දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ කර්මාන්තශාලා කළමනාකරු දිසානායක මුදියන්සේලාගේ ජයසුන්දර ආලක උපේන්ද්‍ර උදයසේන, කළමනාකරු (කාර්මික සබඳතා) තෙල්ගේ මොහාන් තිලක් ලසන්ත පීරිස්, මූල්‍ය කළමනාකාරිනී පාලිකා චන්ද්‍රජීව යන අයවලුන්ගේ සාක්ෂි මෙහෙයවන ලදී. පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පළමුවෙනි පාර්ශ්වයේ වෘත්තිය සමිතිය වෙනුවෙන් ආයතනයේ සේවය අහිමි වූ සේවකයෙකු සහ එහි එවකට සිටි සමලේකම් වන එච්. ඒ. කේ. චන්දන (සහනය පතන සේවකයින් 159 දෙනාගෙන් කෙනෙකු නොවේ.) වෘත්තිය සමිති ආයතනයේ ශාඛාවේ සභාපතිව සිටි යාපා මුදියන්සේලාගේ මඩිත්තේගෙදර ලීලාරත්න බණ්ඩා යන අයවලුන්ගේ සාක්ෂි මෙහෙයවන ලදී. බේරුම්කරණයේ අවසරය ඇතිව එකී ලීලාරත්න බණ්ඩා නැමැති අයගේ මූලික සාක්ෂිය ඇමුණුම් පහක් ද සහිත ව පිටු 06කින් යුක්ත දිවුරුම් පෙත්සමක් මාර්ගයෙන් 2018.03.06 දින ඉදිරිපත් කරන ලද බව සටහන් කරමි.

මෙම පරීක්ෂණයේ දී පළමුවන පාර්ශ්වය විසින් A 1 සිට A 39 දක්වා ද, දෙවන පාර්ශ්වය විසින් X1 සිට X 56 දක්වා ද ලේඛන ලකුණු කරන ලද අතර ඒවායේ අතුරු ලේඛන සහ සටහන් අනු අංක සහ සරළ ඉංග්‍රීසි අක්ෂර වලින් ද සටහන් කරන ලදී. එක් පාර්ශ්වයක් විසින් ස්වකීය පාර්ශ්වය වෙනුවෙන් කළ සාක්ෂි විභාගයන් හි දී ලකුණු කළ ඇතැම් ලේඛන අනෙක් පාර්ශ්වය විසින් ස්වකීය ලේඛන ලෙස ලකුණු කළ අවස්ථා රාශියක් ද විය.

**බේරුම්කරණ ප්‍රදානය අදාළ කිරීම**

මෙම යොමුවට අදාළව ඇති කාර්මික ආරාවුලට අදාළව සේවය අවසන් කරනු ලැබූ පිරිස ලෙස 159 දෙනෙකුගේ ලැයිස්තුවක් යොමුවට අමුණා තිබුණ අතර මෙම බේරුම්කරණ විභාගය අදාළ වන්නේත්, මෙම ප්‍රදානය අදාළ වන්නේත් මේ සමග අමුණා ඇති එකී 159 දෙනාගේ පිරිසට පමණක් බව තීරණය කරමි.

**මෙම කාර්මික ආරවුලට තුඩුදුන් හේතුවවන සහනය පතන සේවකයින් 159 දෙනාගේ සේවය අවසන් කිරීම**

සීමාසහිත රිචඩ් පීරිස් එක්ස්පෝර්ට්ස් හි සේවය කරමින් සිටි සහනය පතන සේවකයින් 159 දෙනාගේ සේවය සේවා යෝජකයා විසින් අවසන් කරනු ලැබීම මෙම කාර්මික ආරවුල උපචිත වීමේ පසුතලයයි. එසේ සේවකයින් 159 දෙනෙකුගේ සේවය අවසන් කරනු ලැබ ඇත්තේ ඔවුන් සාමාජිකත්වය දරන ලංකා වෙළෙඳ හා කර්මාන්ත පොදු සේවක සංගමය (CMU) නමැති වෘත්තිය සමිතියේ මෙහෙයවීමෙන් ගන්නා ලද වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක් වන වැඩ වර්ජනයක නියැලීමේ හේතුව නිසා ය. එකී වැඩ වර්ජනය ආරම්භ කොට පවත්වාගෙන යාමට තුඩුදුන් හේතුව වන්නේ CMU නැමති වෘත්තීය සමිතියේ සේවායෝජක ආයතනය තුළ ක්‍රියාත්මක වන ශාඛාවේ සමලේකම් ධුරය හොබවමින් සිටි එච්. ඒ. කේ. චන්දන නමැති සේවකයාගේ සේවය සේවා යෝජකයා විසින් අත්හිටුවනු ලැබීමයි.

ඕනෑම නඩු කටයුත්තක පොදුවේ දකින්නට ලැබෙන අයුරෙන් මෙහි දී ද එක් අතකින් පැමිණිල්ල කර ඇති සේවක පක්ෂය නියෝජනය කරමින් CMU වෘත්තීය සමිතියත්, අනෙක් අතට වගඋත්තර කියන සේවායෝජක පක්ෂයත් තමා ගත් ක්‍රියාමාර්ගයන් සාධාරණීකරණය කිරීම සඳහා අත්නොහරින තියුණු හබ කිරීමක නිරත වීම මෙහි ද දැඩි ව දක්නට ලැබුණි. ස්වකීය වෘත්තිය සමිති ක්‍රියාකාරක සගයාවන චන්දන නමැත්තාට එරෙහිව අභූත චෝදනාවක් නගා, ඔහුගේ සේවය අත්හිටුවා, නැවත සේවයේ පිහිටුවීම අසාධාරණ ලෙස ප්‍රමාද කරමින් ශාඛා සමිතියේ පැවැත්ම බෙලහීන කිරීම සඳහා කළමනාකාරීත්වය කටයුතු කළ බවත්, ඊට විරෝධය දැක්වීම සඳහා සාධාරණ වැඩ වර්ජනයක් දියත් කළ බවත්, තම වැඩ වර්ජනය කිරීමේ අයිතිය ප්‍රතික්ෂේප කරමින් සේවකයින් 159 දෙනෙකුගේ සේවය අහිමි කළ බවත්, පළමුවන පාර්ශ්වය කියා සිටී. අනෙක් අතට ස්වකීය ආයතනය රටේ ජාතික නිෂ්පාදන කාර්යයේ

ඉතා වැදගත් පංගුකාරයෙකුවන ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කීර්තියක් දිනාගත් අපනයනය මුල්කරගත් ව්‍යාපාරයක් බවත්, අපනයන ඇණවුමක් ලබා ගැනීම ඉතා දුෂ්කර කාර්යයක්වන අතර ලබාගත් අපනයන ඇණවුමක් සඳහා නිෂ්පාදනය කොට බැහැර යැවීමට පිළියෙල කර තිබුණු ගුණත්වයෙන් ඉතා ඉහළ මට්ටමක් සහතික කල යුතු වූ නිෂ්පාදිත භාණ්ඩ ඇසුරුම් අඩංගු පෙට්ටි කීපයක් තුලට කිසිවෙකු විසින් කඩාකප්පල්කාරී ලෙස යම් කළු දියරයක් ඇතුළත් කර තිබුණු බව අනාවරණය වූ බවත්, එය සිදු වූ ආකාරය විමර්ශනය කිරීම සඳහා සේවකයින්ගේ පෞද්ගලික ලොකර් පරීක්ෂා කරන ලද බවත්, එම පරීක්ෂණයේ දී ඉහත සඳහන් කරන ලද චන්දන නැමති සේවකයාගේ ලොකරය තුල විදිනයක් (සිරිංජයක්) තිබී හසු වූ බවත්, ව්‍යාපාරික දෘෂ්ඨී කෝණයෙන් බලන කළ එය ඉතා බැරෑරුම් සහ භයානක කඩාකප්පල්කාරී ක්‍රියාවක් බවත්, ලොකරය තුල සිරිංජයක් තිබීම හේතුවෙන් එකී සේවකයා ගැන මේ කාරණය සම්බන්ධයෙන් සාධාරණ සැකයක් මතු වූ බවත්, ඒ පසුතලය යටතේ එකී සේවකයාගේ සේවය විනය පරීක්ෂණයකට යටත් කොට අත්හිටුවන ලද බවත්, ඊට විරෝධය දැක්වීම සඳහා මෙහි සහනය පතන සේවකයින් 159 දෙනා නීති විරෝධි සහ අසාධාරණ වැඩ වර්ජනයක් ආරම්භ කළ බවත්, දැනුම් දීම් කරන ලද නමුත් නැවත වැඩට වාර්තා නොකළ බැවින් ඔවුන් සියලු දෙනා සේවයෙන් ඉවත් කරන ලද බවත්, සේවා යෝජක දෙවන පාර්ශ්වයේ ස්ථාවරයයි.

මෙම බේරුම්කරණ නිමිත්තේ සහනය පතන සේවකයින් 159 දෙනා අතර සිටින කෙනෙකු නොවුවත් හබයේ කේන්ද්‍රීය පුද්ගලයා වන්නේ ඉහත කී වෘත්තීය සමිතියේ මෙම ආයතන ශාඛාවේ සමලේකම් තනතුර හොබවමින් සිටි චන්දන නැමැත්තා වන අතර බේරුම්කරණ විභාගයේ දී නිගමනයන්ට එළඹීමට පෙර සැකයකින් තොරව නිරාකරණය කර ගත යුතු වන මූලික ප්‍රශ්නය වන්නේ එකී චන්දන නමැත්තාගේ සේවය අත්හිටුවීමට සේවායෝජක ආයතනය ගත් තීරණය සාධාරණ ද යන්න ය.

වසර පහකටත් වැඩි කාලයක් තිස්සේ දීර්ඝ වශයෙන් පවත්වන ලද මෙම බේරුම්කරණ විභාගයේ දී දෙපාර්ශ්වය විසින් මෙහෙයවන ලද සාක්ෂි සම්පිණ්ඩනය කරන කළ මෙම ආරවුලට පසුබිම් වූ සිද්ධිය මෙසේ දක්වමි. මෙම බේරුම්කරණ විභාගයේ දෙවන පාර්ශ්වයේ සේවා යෝජක ආයතනය සීමාසහිත රිචර්ඩ් පීරිස් එක්ස්පෝර්ට් වන අතර එහි ලිපිනය ලෙස දක්වා ඇත්තේ අංක 310, හයිලෙවල් පාර, මහරගම යන්න ය. අනාවරණය වූ කරුණු අනුව එම ලිපිනයේ පිහිටා ඇත්තේ දෙවන පාර්ශ්වයේ සේවා යෝජකයා වන සීමාසහිත රිචඩ් පීරිස් එක්ස්පෝර්ට් ඇතුලත් වන ව්‍යාපාර සමූහයේ මූලස්ථානයයි. මෙම කාර්මික ආරවුල උපචිත වූ සීමාසහිත රිචඩ් පීරිස් එක්ස්පෝර්ට් සේවායතන කර්මාන්තශාලා වැඩබිම පිහිටා ඇත්තේ අංක 10, රජ මාවත, ඒකල යන ලිපිනයේ ය. මෙම සිද්ධියට අදාල වකවානුව වන 2007 වර්ෂය වන කාලයේ දී මෙහි කර්මාන්තශාලා කළමනාකරු ලෙස ප්‍රියන්ත අබේගුණවර්ධන නමැත්තෙකුත්, නිෂ්පාදන කළමනාකරු ලෙස ලක්ෂ්මන් වික්‍රමසිංහ නමැත්තෙකුත් සේවයේ නිරත වී සිට ඇත. ඔවුන් දෙදෙනාම මෙම බේරුම්කරණ විභාගයේ දී සාක්ෂි දීම සඳහා දෙපාර්ශ්වයෙන්ම නොකැඳවන ලද අතර ඔවුන් දෙදෙනාම මේ වන විට, ආයතනයේ සේවය කරන්නේ ද නැත. කෙසේ වුවත් ඔවුන් මෙම කාර්මික ආරවුලට සම්බන්ධ සිද්ධි මාලාවේ ඉතා වැදගත් ක්‍රියාකාරී පංගුකාරයින් දෙදෙනෙකු බව විභාගයේ දී එළිදරවු විය.

මෙම කර්මාන්ත ආයතනය විවිධ භාණ්ඩ නිෂ්පාදනය කරන අතර එහි කාර්මික නිෂ්පාදනයන් අතර බෝතල් මූඩි සවිමත්ව වැසීමේ දී බෝතලය සහ පියන මුද්‍රිතව වැසීම සඳහා සවිකිරීමට භාවිත කරන රබර් වළළු ("Rubber Jar Sealing Rings") (මින්පසු මෙම වාර්තාවේ දී "රබර් වළළු" යන පදය ඊට යොදා ගැනේ.) ඒවා ඉතා ඉහළ ප්‍රමිතියකින් සහ දැඩි ගුණාත්මක භාවයකින් යුතු ව නිෂ්පාදනය කළ යුතු වූ අපනයන භාණ්ඩයක් වන අතර, වර්ෂ 07ක පමණ කාලයකට ඒවා සැපයීමට ප්‍රංශයේ සමාගමක් සමග 2007 වර්ෂයේ දී දෙවන පාර්ශ්වයේ ආයතනය ගිවිසුම්ගත වී තිබිණි. ඉතා ලාභදායී ඉපැයුමක් සහතික කළ මෙම සැපයුමේ දී වර්ෂයකට බහලුම් 30ක පමණ නිෂ්පාදිතයන් අපනයනය කිරීමට සේවා යෝජක ආයතනය බැඳී තිබුණි.

මේ සඳහා අවශ්‍ය වන නිෂ්පාදන ක්‍රියාවලිය එකී ඒකල කර්මාන්තශාලා වැඩබිමේ සිදුවෙමින් පවතිද්දී 2007.10.26 වැනි දින ආයතනයේ තත්ත්ව පාලන අංශයේ නිලධාරීන් පිරිසක් විසින් සිදු කරන ලද කිසියම් නිමැවුම් පරීක්ෂාවක දී අපනයනය සඳහා අසුරා ඇති පෙට්ටි ඇතුළත බහා තිබුණු රබර් වළළු අඩංගු පොලිතීන් ඇසුරුම් තුල කිසියම් කළු දියරයක් තැවරී තිබුණු බව අනාවරණය වී ඇත. එක් පොලිතින් ඇසුරුමක රබර් වළළු 10ක් ද, එක් පෙට්ටියක් තුල එබඳු පොලිතින් ඇසුරුම් 100ක් ද ඇතුලත් කෙරේ. මෙසේ අපනයනය සඳහා සූදානම් කර තිබුණු නිෂ්පාදිතයකට කළු වර්ණයක් ඇතුළත් කොට ඒවායේ ගුණාත්මකභාවයට හානි කිරීම භයානක ප්‍රතිවිපාක ගෙන දෙන මහා ගැටළුවක් ලෙස සැළකූ කම්හල් කළමනාකාරිත්වය මූලස්ථානයේ කළමනාකාරිත්වය සමග සාකච්ඡා කොට කිසියම් පුද්ගලයෙකු විසින් කඩාකප්පල්කාරී චේතනාවකින් මෙම නිෂ්පාදිතයන් අඩංගු ඇසුරුම්වලට කිසියම් කළු දියරයක් විද ඇතැයි යන උපකල්පනය මත එබන්දක් සිදු වීමට ඇති මාර්ගයන් ගැන අවධානය යොමු කොට ඇත. එම කළු දියරය කිසියම් එන්නත් විදිනයක් නැතිනම් සිරිංජයක් (Syringe) ආධාරයෙන් පෙට්ටි තුලට ඇතුලත් කර ඇතැයි යන සැකය මත, එවැනි සිරිංජයක් ඇත්දැයි සොයා බැලීමේ අරමුණෙන් සේවකයින්ගේ පෞද්ගලික ඇඳුම් පැළඳුම් බහා තබන ලොකර් පරීක්ෂා කිරීමට කළමනාකාරිත්වය තීරණයක් ගෙන ඇත. ඒ අනුව වැඩබිමෙහි නිෂ්පාදන සහායක චන්දික සිල්වා, වැඩ සුපරීක්ෂකවරුන් දෙදෙනෙකු වන රවීන්ද්‍ර සිල්වා, ආර්. සුනිල්රත්න සිල්වා සහ ප්‍රධාන ආරක්ෂක නිලධාරි ජේ. එම්. බී. පීරිස් යන අයවලුන්ගෙන් සමන්විත පරීක්ෂක මණ්ඩලයක් විසින් සියලුම සේවකයින්ගේ ලොකර ඒ ඒ සේවකයා ඉදිරියේ විවෘත කර පරීක්ෂා කරනු ලැබ ඇත. මෙම පරීක්ෂණ මණ්ඩලය 2007.10.26 වැනි දින මෙම කාර්මික ආරවුලේ ප්‍රස්තුතයට අදාල සේවකයා මෙන් ම වෘත්තිය සමිති ක්‍රියාකාරකයෙකු ද වන එච්. ඒ. කේ. චන්දන යන අය පරිහරණය කරමින් සිටි ලොකරය ඔහු ද සහභාගි කරගෙන පරීක්ෂා කරනු ලැබ ඇත. එහි දී එම ලොකරයේ පාවහන් බහා තැබීම සඳහා චන්දන විසින් භාවිත කරන ලද පහත මාලයේ තිබී සිරිංජයක් සොයාගෙන ඇත. සිරිංජය සොයාගැනීමෙන් පසු එච්. ඒ. කේ. චන්දන යන අයගේ ප්‍රකාශයක් සටහන් කර ගනු ලැබ ඇති අතර, එය පළමුවන පාර්ශ්වය විසින් A 1 වශයෙන් ද, දෙවන පාර්ශ්වය විසින් X 2 වශයෙන් ද මෙම පරීක්ෂණයේ දී ලකුණු කරන ලදී. තව ද, මේ කටයුත්තට අදාල ව කණ්ඩායම් පරීක්ෂාව සිදු

කළ ජේ. එම්. බී. පීරිස්, රවීන්ද්‍ර ද සිල්වා, සුනිල්රත්න සහ චන්දික සිල්වා යන අයවලුන්ගෙන් ලබා ගන්නා ලද ප්‍රකාශයන් X4c, X4d, X4e සහ X4g යනුවෙන් ලකුණු කරන ලදී. අනතුරුව එකී චන්දන යන අයගේ සේවය විනය පරීක්ෂණයක් පවත්වන තෙක් වැටුප් රහිතව අත්හිටුවමින් සාමාන්‍යාධිකාරිගේ අත්සනින් යුතු වූ 2007.10.29 දිනැති ලිපිය (A15 සහ X3 වශයෙන් දෙපාර්ශ්වයෙන් ම ලකුණු කළ) 2017.10.31 දිනයේ දී ඔහුට බාර දෙනු ලැබ ඇත. මේ අතරතුර කළු පැහැය තැවරුණු පොලිතින් ඇසුරුම් සාම්පල හා ප්‍රශ්නගත සිරිංජය තාක්ෂණික පරීක්ෂණයක් සඳහා ITI ආයතනය යොමු කරනු ලැබ, අංක SS11310 දරන අදාළ පරීක්ෂණ වාර්තාව 2007.11.30 වැනි දින නිකුත් කර ඇත.

මේ අතරතුර CMU වෘත්තිය සමිතියේ සේවායෝජක ආයතනයේ ක්‍රියාත්මක වූ ශාඛාවේ සමලේකම්ගේ අත්සනින් සේවායෝජකයා අමතා ඇති 2007.10.30 වැනි දිනැති ලිපියකින් කියා ඇත්තේ "එම්. චමින්ද" නැවත සේවයේ නොපිහිටුවුවහොත් 2007.10.30 වැනි දින දහවල් 12.00 සිට 2007.10.31 දින උදෑසන 6.00 වනතෙක් වැඩ නැවැත්වීමක් කරන බවයි. මේ සම්බන්ධයෙන් සාක්ෂි විභාගයේ දී සැබැවින් එම වර්ජන දැනුම්දීම මෙම බේරුම්කරණ විභාගයට අදාල සේවය අත්හිටුවීමකට ලක්ව සිටි චන්දන නමැත්තා පිළිබඳ ව ද නැතිනම් වෙනත් සේවකයෙකු පිළිබඳව ද යන්න පිළිබඳ ව දෙපාර්ශ්වයෙන් හබ කෙරුණි. ඉන් තහවුරු වූයේ එකී වැඩ වර්ජන දැනුම්දීම 798 දරන සේවක අංකය හිමි එම්. චමින්ද නමැති සෙවකයෙකුට සම්බන්ධ කරුණක් මිස 7078 දරන සේවක අංකය හිමි මෙහි දී අදාල වන එච්. ඒ. කේ. චන්දනට සම්බන්ධ එකක් නොවන බවයි.

අනතුරුව A14 සහ X14 ලෙස ලකුණු කළ 2007.11.26 දිනැති ලිපියෙන් ලංකා වෙළෙඳ කාර්මික සහ පොදු කම්කරු සංගමයේ රිචඩ් පීරිස් අපනයන සමාගම් ශාඛාවේ සමලේකම් සහ සභාපති විසින් අත්සන් කොට ආයතනයේ සාමාන්‍යාධිකාරී ඇමතු ලිපිය මගින් චන්දන නමැත්තාට අදාල පරීක්ෂණය ඉක්මනින් පවත්වා ඔහුගේ සේවය නැවත පිහිටුවන ලෙස ඉල්ලා, එසේ නොකෙරෙන්නේ නම් 2007.11.29 දින සිට අතිකාල වර්ජනයක් කරන බව දැනුම් දී ඇත. X15 ලෙස ලකුණු කරන ලද ලිපියකින් එකී ලිපියට ප්‍රතිචාර දක්වා ඇති සේවායෝජක ආයතනයේ සාමාන්‍යාධිකාරී විසින් දන්වා ඇත්තේ එසේ අතිකාල වර්ජනයක් සිදු කිරීමෙන් බලවත් අගතියක් සිදු වන නිසා එම ක්‍රියාවෙන් වැළකී සිටින ලෙස අවවාද කරන බවයි. කෙසේ හෝ මෙම අතිකාල වර්ජනය නොකිරීමට තීරණය කළ බවට X17 ලෙස ලකුණු කළ ලිපියෙන් එකී ශාඛා වෘත්තිය සමිතිය විසින් සාමාන්‍යාධිකාරී වෙත දැනුම් දී ඇත.

A15 සහ X3 ලෙස ලකුණු කළ ලිපිය මගින් කළමනාකාරිත්වය මගින් එච්. ඒ. කේ. චන්දනගේ සේවය අත්හිටවීමෙන් පසුව A18 සහ X6 ලෙස ලකුණු කළ ආයතනයේ සමූහ මානව සම්පත් ප්‍රධානි අත්සන් කළ 2007.12.11 දිනැති ලිපිය මගින් චන්දන වෙත චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත. චන්දන විසින් 2007.12.19 දින ඊට දෙන ලද පිළිතුරු A19 සහ X7 වශයෙන් ලකුණු කොට පරීක්ෂණයේ දී ඉදිරිපත් කෙරුණි.

මේ අතරතුර දී ම 2007.12.11 (A16 සහ X21 ලෙස ලකුණු කළ) දාතමින් ලංකා වෙළෙඳ කාර්මික සහ පොදු කම්කරු සංගමයේ (මව් සංගමයේ) ප්‍රධාන ලේකම් බාලා තම්පෝ මහතාගේ අත්සනින් චන්දන නමැත්තාගේ සේවය අත්හිටුවීම පදනම් විරහිත බැවින් ඒ සම්බන්ධයෙන් විරෝධය පළ කොට ඔහු නැවත සේවයේ පිහිටුවීමට ආයතනය අපොහොසත් වන්නේ නම් වෘත්තිය සමිති ශාඛාව විසින් ගනු ලබන කවර ආකාරයක හෝ වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක් අනුමත කිරීම පිණිස මව් සංගමයේ කාරක සභාව 2007.11.18 වැනි දින එහි පැවැත්වෙන මහා සභාවට නිර්දේශ කරනු ලබන බව සාමාන්‍යාධිකාරී වෙත දැනුම් දී ඇත. A17 සහ X22 ලෙස ලකුණු කළ ආයතනයේ සමූහ මානව සම්පත් ප්‍රධානි විසින් වෘත්තිය සමිතියේ ප්‍රධාන ලේකම් ඇමතු ලිපියකින් ඊට නොසතුට පළකොට ආයතනයේ ස්ථාවරය පැහැදිළි කොට ඇත. ඉන්පසු A21 සහ X23 ලෙස ලකුණු කළ වෘත්තිය සමිති මව් සංගමයේ ප්‍රධාන ලේකම් විසින් එවන ලද ලිපියකට A22 සහ X24 ලෙස ලකුණු කළ ආයතනයේ කළමනාකාරිත්වය නැවත පිලිතුරු සපයනු ලැබ ඇත. අනතුරුව වෘත්තිය සමිතියේ මවු සංගමයේ ප්‍රධාන ලේකම්ගේ 2008.01.04 දිනැති ලිපියෙන් (A23) නැවතත් කළමනාකාරිත්වයට දැනුම් දී ඇත්තේ 2007.12.28 වැනි දින තමා ආයතනයේ මානව සම්පත් ප්‍රධානි ජයවර්ධන මහතා වෙත වැඩ වර්ජනයක් කරන බව දුරකතනයෙන් දැනුම් දුන් බවත්, එහි මහා සභාව 2007.12.28 වැනි දින සිට වැඩවර්ජනයක් කිරීමට ශාඛා සමිතියට අනුමතිය දීමට ඒකමතිකව තීරණය කර ඇති බවත් ය.

A24 සහ X1 ලෙස ලකුණු කළ වෘත්තිය සමිති ශාඛාවේ සමලේකම්ගේ අත්සනින් යුතු දැන්වීමක් මගින් 2007.12.28 වැනි දින සිට වැඩවර්ජනයක් කරන බව දැනුම් දෙමින් ඊට සහයෝගය දෙන ලෙස තම සාමාජික සාමාජිකයින්ගෙන් ඉල්ලීමක් කර ඇත. එය දාතම රහිත දැන්වීමකි.

2007.12.28 වැනි දින චන්දන සේවයේ පිහිටුවා ගැනීම අරමුණු කරගත් වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක් ලෙස මෙහි කාර්මික ආරවුලට මුල් වූ සේවක වර්ජනය ආරම්භ කර ඇත. වැඩවර්ජකයින් ඒකරාශී වී වැඩට එන සේවකයින්ටත්, ආයතනයේ කළමනාකාරිත්වයටත්, නිලධාරින්ටත් අපහාස, තර්ජන ආදිය කළ බවට පොලිස් පැමිණිලි කීපයක් කරනු ලැබූ බවට සාක්ෂි මෙහෙයවුණි. මේ අතරතුර වැඩ වර්ජනය නීති විරෝධී බවට ප්‍රකාශ කරවා ගැනීම ඇතුළු සහනයන් රැසක් පතා ආයතනය කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත.

වැඩවර්ජනය කරන ලද සේවකයින් අමතා 2007.12.28 දිනැති ව කළමනාකාරිත්වය විසින් ඔවුන්ට සේවයට වාර්තා කරන ලෙස දැනුම් දීමක් කරනු ලැබ ඇත. එසේ දැනුම් දුන් ලිපි කීපයක් X27, X28 ලෙස ලකුණු කොට ඉදිරිපත් කෙරුණි. ඒ නිවේදනයන්ට කීකරු

නොවී වැඩවර්ජනය දිගින් දිගටම කරගෙන ගිය සේවකයින් 159 දෙනෙකුගේ සේවය එක් එක් සේවකයාට පෞද්ගලිකව යොමු කරන ලද 2008.01.03 දිනැති සමූහ මානව සම්පත් ප්‍රධානිගේ ලිපි මගින් 2007.12.28 දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කරනු ලැබ ඇත. එසේ දැනුම් දුන් ලිපියක් X29 ලෙස ලකුණු කොට ඉදිරිපත් කෙරුණි.

මෙම ආරවුල කම්කරු කොමසාරිස් වෙත සමථකරණයෙන් විසඳීම සඳහා යොමු කරනු ලැබ, කරන ලද සාකච්ඡාවක දී එකී සේවය අවසන් කරනු ලැබූ සේවකයින් 159 දෙනා අතුරෙන් සේවායෝජක විසින් තෝරාගන්නා ලද සේවකයින් 105 දෙනෙකු නැවත සේවයට ගැනීමට කළමනාකාරිත්වය එකඟත්වය පළකර ඇත. වෘත්තීය සමිතියේ ඉල්ලීම වී ඇත්තේ වර්ජනයට සහභාගි වූ සේවකයින් 159 දෙනා ම නැවත සේවයේ පිහිටුවිය යුතු බවයි. ඒ හබය නිරාකරණය නොවූ බැවින් කාර්මික ආරවුල දිග්ගැස්සී ඇත.

**මෙම බේරුම්කරණ විභාගයට A3249 දරන බේරුම්කරණ විභාගයේ සම්බන්ධය**

මෙම බේරුම්කරණයේ කාර්මික ආරවුලට සම්බන්ධ වැඩ වර්ජනය මෙහෙයවීමට හේතු වූ මූලික සාධකය වන සේවය අත්හිටුවීමට ලක් වූ එච්. ඒ. කේ. චන්දන නැමැත්තාගේ සේවය අවසන් කිරීමට එරෙහිව කම්කරු අමාත්‍යවරයා විසින් යොමු කරන ලද A3249 දරන යොමුව ප්‍රකාරව මෙයට පෙර කාර්මික අධිකරණයේ බේරුම්කරණ විභාගයක් පවත්වනු ලැබ ඇති අතර එහි ප්‍රදානය A20 සහ X11 වශයෙන් ලකුණු කරන ලදී. ඉහත දී සඳහන් කරන ලද පරිදි එම බේරුම්කරණ විභාගය පවත්වා ඇත්තේ බේරුම්කරු ටී. පියසෝම මහතා ය. සේවකයින් 159 දෙනාගේ සේවය අවසන් කිරීම පිළිබඳ මෙම කාර්මික ආරවුල විසඳීම සඳහා මෙම බේරුම්කරණ යොමුව මා වෙත යොමු කිරීමට පෙරාතු ව එය ද ඉහත කී බේරුම්කරු ටී. පියසෝම මහතා වෙතම යොමු කර තිබුණි. ස්වභාවික යුක්ති මූලධර්ම ඇතුළු කරුණු රාශියක් මුල් කරගෙන තමන්ට අගතියක් වන බව කියා සිටිමින් එකී යොමුව පියසෝම මහතා වෙත ම පැවරීම වළක්වාලන රිට් ආඥාවක් අයැදමින් මෙහි දෙවන පාර්ශ්වයේ සේවායෝජක ආයතනය අභියාචනාධිකරණයේ අංක : 611/2009 දරන නඩුව පැමිණිලි කර ඇත. එම නඩුවේ පෙත්සම X42 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර එහි තීන්දුව දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැළකිරීම්වල "ඒ" ඇමුණුම ලෙස ඉදිරිපත් කර ඇත. එම පෙත්සම්කරු වන ආයතනයේ වාසියට තීන්දු වූ එම නඩුවේදී ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ඉහත කී A 3249 බේරුම්කරණ විභාගය පැවැත්වූ ටී. පියසෝම මහතා විසින් ම මෙම යොමුවට අදාල බේරුම්කරණ විභාගය නොපැවැත්විය යුතු බවයි. ඒ අනුවයි, IR/21/03/2008(A) සහ 2013.09.23 දිනැති කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් මෙම ආරවුල බේරුම්කරණයෙන් සමථයකට පත් කිරීමට මා වෙත නැවත යොමු කරනු ලැබුවේ.

මා මෙම විභාගය පවත්වාගෙන යන අතරතුර ඉදිරිපත් වූ ඉතා වැදගත් ප්‍රශ්නයක් වූයේ ඉහත කී A3249 බේරුම්කරණ විභාගයේ දී මෙහෙයවන ලද සාක්ෂි මෙම පරීක්ෂණයේ දී අදාල කරගත හැකි ද? හැකි නම් ඒ කවර සීමාවන්ට යටත් ව ද? යන්න ය.

එකී A3249 දරන බේරුම්කරණ විභාගයත්, එහි සාක්ෂි මෙහෙයවීම් අන්තර්ගත කාර්ය සටහනුත්, එහි ප්‍රදානයත් මෙම බේරුම්කරණ විභාගය සඳහා ඉඳුරාම අදාල කරගත හැකිනම් මෙම කාර්මික ආරවුල සම්බන්ධයෙන් ප්‍රදානයක් ලබා දීමේ දී විසඳිය යුතු කරුණු අතුරෙන් සියයට හැත්තෑ පහක් විභාගයකින් තොර ව ඉතා පහසුවෙන් විසඳාගත හැකිව තිබිණි.

එහෙත් ඉහතින් සඳහන් කළ 611/2009 දරන අභියාචනාධිකරණ නඩුවේ තීන්දුවේ හරය විශ්ලේශනය කර බැලීමෙන් පසු මා ගත යුතු තීරණය විය යුත්තේ එම විභාගයේ කාර්ය සටහන්වත්, ප්‍රදානයවත් දෙස නොබලාම ස්වාධීන විභාගයක් ලෙස මෙය පවත්වාගෙන යාමයි. එසේ වුවත් ඒවා ගෙන ඒමෙන් වාසියක් අත්කර ගැනීමට උත්සාහ ගත් පළමුවන පාර්ශ්වය පමණක් නොව, A3249 දරන විභාගයේ කාර්ය සටහන් ලකුණු කළ ලේඛන ලෙස ලකුණු කර ඉදිරිපත් කරමින් දෙවන පාර්ශ්වය ද සාක්ෂි මෙහෙයවා ඒවා ලේඛන ලෙස ඉදිරිපත් කර ඇති විට ඒවා කෙරෙහි අවධානය යොමු නොකර සිටීමට ද මට අවකාශයක් නැත. කෙසේ වෙතත් උපරිම ලෙස සාධාරණත්වය ඉටු කිරීමේ අදහසින් හැකිතාක් එකී A3249 දරන විභාගය මත නොරැඳීමට මම වගබලාගතිමි. දෙවන පාර්ශ්වයේ ප්‍රධාන තර්කය වූයේ මෙහි සාක්ෂි නොදෙන, එහෙත් A3249 දරන විභාගයේ දී සාක්ෂි දුන් ඇතැම් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් මෙම විභාගයේ දී සාක්ෂි දෙන වෙනත් සාක්ෂිකරුවෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කිරීම යෝග්‍ය නොවන බවයි. විශේෂයෙන් ම එකී සාක්ෂි වල අන්තර්ගතය වෙනත් පුද්ගලයෙකුගේ මුවින් ලබා ගැනීමේ දී ඒවා ප්‍රවාදක සාක්ෂි ගණයට වැටෙන බැවින් ඒවා අදාල කර නොගත යුතු බවයි. මෙහි දී පළමුවන පාර්ශ්වය බෙහෙවින් මත්, ඇතැම් අවස්ථාවල දෙවන පාර්ශ්වයත් විභාගයේ දී සඳහන් බෙහෙවින් සාකච්ඡාවට භාජනය වූ ප්‍රධාන පුද්ගලයින් දෙදෙනෙකු වන එවකට දෙවන පාර්ශ්වයේ ආයතනයේ සාමාන්‍යාධිකාරී ලෙස සේවය කළ ප්‍රියන්ත අබේගුණවර්ධන මහතාත්, ජ්‍යෙෂ්ඨ ආරක්ෂක කළමනාකරු ලසිත් ප්‍රනාන්දු මහතාත් සාක්ෂි මෙහෙයවීම සඳහා නොකැඳවීම මගින් අනාවරණය කරගත යුතු වන වැදගත් කරුණු රැසක් පිළිබඳව මට තොරතුරු ලබා ගැනීම පිණිස A3249 විභාගයේ දී ඔවුන් විසින් දෙන ලද සාක්ෂිවල ඇතුලත් කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමට සිදුවීම වැළැක්විය නොහැක. කාර්මික ආරවුල් පනතේ විධිවිධාන ප්‍රකාර ව ඉදිරිපත් වන කරුණු මත පමණක් නොව, සියලු කරුණු සොයා බලා තීරණයන්ට එළඹීමේ ලා බේරුම්කරුවෙකුගේ වගකීම මට මේ අවස්ථාවේ දී පැහැර හැරිය නොහැකි ය.

**මෙම සේවකයින් 159 දෙනාගේ සේවය අවසන් කිරීම අයුක්ති සහගත ද? නීති විරෝධී ද ?**

මෙම බේරුම්කරණ නිමිත්තට අදාල යොමුවේ සඳහන් කාර්මික ආරවුලට සම්බන්ධ ව මූලික වශයෙන් තීරණයක් දිය යුතු වන්නේ මේ ප්‍රශ්නයට යි. සේවායෝජක ආයතනයේ සමූහ මානව සම්පත් ප්‍රධානී වී. කේ. ජයවර්ධන මහතාගේ අත්සනින් යුතු ව නිකුත් කරන ලද 2008.01.03 දිනැති ලිපි මගින් සීමාසහිත රිචඩ් පීරිස් එක්ස්පෝර්ට්ස් හි සේවය කළ සේවකයින් 159 දෙනෙකුගේ

සේවය මෙහි ප්‍රස්තුත වැඩ වර්ජනය ආරම්භ කළ 2007.12.28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කරන ලද බව හබ කිරීමකින් තොරව දෙපාර්ශ්වය විසින්ම පිළිගනු ලැබූ කරුණකි.

දෙවන පාර්ශ්වය විසින් මුළු විභාගය පුරාවටමත්, ස්වකීය අවසන් ලිඛිත සැළකිරීම්වලිනුත් වෙනත් කරුණු අතර ඉතා ප්‍රකටව තහවුරු කිරීමට වෑයම් කර ඇති කරුණු කීපයකි.

(අ) මෙහි ඉල්ලුම්කාර වෘත්තිය සමිතිය දියත් කළ වැඩ වර්ජන ක්‍රියාමාර්ගය ඊට සහභාගි වූ සේවකයින්ගේ සේවය අහිමි කිරීමට පදනම වූ බව.

(ආ) ඉල්ලුම්කාර වෘත්තිය සමිතිය විසින් වගඋත්තරකාර සේවායෝජක වෙත නීතියෙන් අපේක්ෂිත පරිදි වැඩ වර්ජන ක්‍රියාමාර්ගය පිළිබඳ නිසි පූර්ව දැනුම් දීමක් නොකිරීම හේතුවෙන් එය නීති විරෝධී එකක් බව.

(ඇ) ඉල්ලුම්කාර වෘත්තිය සමිතියේ සාමාජික එච්. ඒ. කේ. චන්දන නමැති සේවකයාගේ වැඩ වැටුප් රහිතව අත්හිටුවීම විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීම හේතුවෙන් සිදු වූවක් වූ අතර, සේවායෝජක විසින් එසේ විනය ක්‍රියාමාර්ගයක් ගැනීම පදනම් කරගෙන වෘත්තිය සමිතිය විසින් දියත් කරන ලද වැඩ වර්ජනයක් වූ නිසා එය අසාධාරණ එකක් බව.

(ඈ) අපනයනය සඳහා සූදානම් කර තිබුණු රබර් වළළු ඇසුරුම් තුලට කළු දියරයක් ඇතුලත් කිරීමෙන් ආයතනයේ ප්‍රතිරූපයට හානියක් වන සේ කඩාකප්පල්කාරී ක්‍රියාවක් කිසියම් පුද්ගලයෙකු විසින් සිදු කර තිබුණේ යයි අනාවරණය වූ බව, සහ එවැනි කළු දියරයක් මුද්‍රිත ඇසුරුමක් තුලට විදීමට භාවිත කළ හැකි සිරිංජයක් චන්දන නමැත්තාගේ ලොකරය තුල තිබී සොයා ගත් බව.

(ඉ) චන්දන නමැත්තාට විරුද්ධව චෝදනා නැගීමට පෙර ඔහුගේ ලොකරයෙන් සොයාගත් එකී සිරිංජය අපක්ෂපාතී තාක්ෂණික පරීක්ෂණයක් ITI ආයතනය ලවා සිදු කරවා ගැනීම, චන්දන නමැත්තාට එරෙහි ව චෝදනා පත්‍රයක් නිකුත් කොට, අපක්ෂපාතී විනිශ්චය සභාවක් මගින් විධිමත් ගෘහස්ත පරීක්ෂණයක් පැවැත්වීම මගින් නිසි විනය පටිපාටිය අනුගමනය කළ බව.

(ඊ) එසේ විෂමාචාරී චෝදනාවක් එල්ල වන සේවකයෙකුට එරෙහි ව විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට ආයතනයක පාලනාධිකාරියට අයිතියක් ඇති බව, සහ එසේ විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කළ පමණින් ඊට විරුද්ධ ව වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ගැනීම අසාධාරණ බව සහ නීති විරෝධී බව.

(උ) ඉහළ ම ගුණත්වයක් රැකිය යුතු අපනයන භාණ්ඩයකට කළු දියරයක් ඇතුලත් කිරීමෙන් සිදු වීමට ඉඩ තිබුණු බරපතල විනාශය සහ ආයතනයේ ප්‍රතිරූපයට ඉන් බරපතල හානියක් සිදු වීමට ඉඩ තිබුණු බව.

(ඌ) වැඩ වර්ජකයින් කළහකාරී ව හැසුරුණු බව.

(එ) සේවකයින් 159 දෙනෙකුට වන්දියක් ගෙවීමේ නියමයක් කරනු ලැබුවහොත් ආයතනයේ මූල්‍ය තත්ත්වය ඊට යෝග්‍ය ශක්තිමත් මට්ටමක නොතිබෙන බව.

ඉහත කී දෙවන පාර්ශ්වයේ ස්ථාවරයන් සනාථ කිරීමට ඉතා තියුණු ලෙස මෙහෙයවූ සාක්ෂි විභාගයන් ද, අවසන් ලිඛිත සැළකිරීම්වල ඇතුලත් ඉතා ව්‍යක්ත ලෙස ගෙනහැර දැක්වූ සාක්ෂි සම්පිණ්ඩනයන් සහ නීති තර්කයන් ද පිළිබඳ ව මගේ අවධානය සහ සැළකිල්ල ඉතා ගැඹුරෙන් යොමු කරන ලද අතර ඒවායේ උධෘතයන් පුන පුනා මෙහි ගෙනහැර දැක්වීමට අදහස් නොකරමි.

අනෙක් අතට පළමුවන පාර්ශ්වයේ වෘත්තිය සමිතිය වෙනුවෙන් පරීක්ෂණය පුරාවට සාක්ෂි මෙහෙයවීම තුලිනුත්, අවසාන ලිඛිත සැළකිරීම්වලිනුත් මතු කර දැක්වීමට වෑයම් කළ කරුණු අතර ප්‍රමුඛ වන්නේ ඉහත කී කරුණු සම්බන්ධයෙන් හබ කිරීමකි. ඔවුන්ගේ ස්ථාවරය තුල වෙනත් කරුණු අතර ප්‍රකට ව තහවුරු කිරීමට වෑයම් කර ඇති කරුණු කීපයකි.

(අ) වෘත්තිය සමිතියකට සහ එහි සාමාජිකයින්ට වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයන්හි නියැළීමටත්, විශේෂයෙන් වැඩ වර්ජනවල නිරත වීමටත් අයිතිය තහවුරු වී ඇති බව.

(ආ) මෙහි ඉල්ලුම්කාර වෘත්තිය සමිතියේ සාමාජිකයින් ගත් වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයත්, විශේෂයෙන්ම 2007.12.28 වැනි දින දියත් කළ වැඩ වර්ජනය යුක්ති සහගත සහ සාධාරණ එකක් බව, එය කවර ආකාරයකින් වත් නීති විරෝධී හෝ අසාධාරණ එකක් නොවන බව.

(ඈ) සේවායෝජකායතන ශාඛාවේ සමලේකම් ලෙස කටයුතු කරමින් සාමාජිකයින්ගේ වෘත්තිය අයිතිවාසිකම් රැකදීමට කැප වූ නායකයෙකු වන එච්. ඒ. කේ. චන්දන නමැත්තා අභූත චෝදනාවක් නගා දීර්ඝ කාලයක් විනය පරීක්ෂණයක් නොපවත්වමින් තබාගෙන, වැටුප් ගෙවීමකින් තොර ව සේවය අත්හිටුවීමෙන් බරපතල සේවක අසාධාරණයක් පාලනාධිකාරිය විසින් සිදු කළ බව.

(ඇ) ශාඛා වෘත්තිය සමිතියේ ක්‍රියාකාරීන්ට වරදානයන් ලබා දෙන්නට ගත් උත්සාහයන් අසාර්ථක වීමෙන් පසුව, චන්දන නමැති එහි සමලේකම්වරයාට බොරු චෝදනාවක් එල්ල කොට ඔහුගේ සේවය අහිමි කොට, එකී වෘත්තිය සමිතියේ ක්‍රියාකාරිත්වය බෙලහීන කිරීමට සේවායෝජක ආයතනයේ පාලනාධිකාරිය උපක්‍රමශීලීව කටයුතු කළ බව.

(ඉ) එකී චන්දන නමැත්තාට නගා තිබුණේ ඔහුගේ කිසිදු දැනීමක්වත් නොතිබුණු සිද්ධියකට අදාල අභූත චෝදනාවක් බව සහ ඔහු ඉතා වගකීමකින් කටයුතු කළ වෘත්තිය සමිති ක්‍රියාකාරියෙකු සහ ඉතා හොඳ සේවකයෙකු බව.

(ඊ) ආයතනය අපනයනය කිරීමට සූදානම් කර තිබූ රබර් වළළු ඇසුරුම් තුලට යම් පුද්ගලයෙකු විසින් කළු දියරයක් ඇතුලත් කර තිබීම සම්බන්ධ ව එසේ කිරීමට භාවිත කළ හැකි ආකාරයේ කටුවක් රහිත හිස් සිරිංජයක් චන්දනගේ ලොකරය තුල තිබී හමු වීම පිළිබඳ ව ඇතිකර ගන්නා ලද සැකය පදනම් විරහිත බව.

(උ) සොයාගන්නා ලදැයි කියන හිස් සිරිංජය ITI ආයතනයට පරීක්ෂණය සඳහා යැවෙන විට කළු කුඩු වර්ගයක් ඇතුලත් සිරිංජයක් බවට පත්වීම මත සිරිංජය සොයාගත් අවස්ථාවේ සිට පරීක්ෂණයට එය විවෘත කරන අවස්ථාව දක්වා පියවරයන් සැක සහගත බව.

(ඌ) වර්ජකයින්ගේ නොමනා හැසිරීම සහ ක්‍රියාකලාපයන් හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවන් තිබුණේය යන්න අසත්‍යයක් බව.

**එච්. ඒ. කේ. චන්දන නමැත්තාගේ සේවය අත්හිටුවීම**

ඉහත විස්තර කර ඇති ආකාරයට ආයතනයේ CMU වෘත්තීය සමිති ශාඛාවේ සමලේකම් ධූරය දරමින් සිටි එච්. ඒ. කේ. චන්දන නම් වූ වෘත්තිය සමිති ක්‍රියාකාරකයාගේ සේවය අත්හිටුවීම මෙම කාර්මික ආරවුලේ කේන්ද්‍රීය කාරණයයි.

159 දෙනෙකුගේ සේවය අහිමි කිරීමට හේතු වූ වැඩ වර්ජනය දියත් වන්නේ තමන්ගේ සේවා අයිතිවාසිකම් වෙනුවෙන් හැමවිටම කැපවීමකින් යුතුව පෙනී සිටි, අසාධාරණ ලෙස සේවය අත්හිටුවනු ලැබූ වෘත්තිය සමිති ක්‍රියාකාරිකයා නැවත සේවයේ පිහිටුවා ගැනීමේ අභිප්‍රාය ඇතිව ය. එහි දී වැඩ වර්ජකයින් එක හඬින් කියා සිටියේ චන්දන ආයතනයෙන් ඉවත් කොට වෘත්තිය සමිතිය බෙලහීන කිරීම සඳහා ඔහුට එරෙහිව පදනම් විරහිත සහ අසාධාරණ චෝදනාවක් එල්ල කළ බවයි. එම චෝදනාව කිසිදු පදනමකින් තොර අසත්‍ය එකක් බව වැඩ වර්ජනයේ යෙදුණු ශාඛා සමිති සාමාජිකයින්ගේ මෙන්ම, CMU මවු සංගමයේ ද බරපතල සහ නොබිඳුණු විශ්වාසය විය.

අපනයනය සඳහා සූදානම් කර තිබුණු රබර් වළළු ඇතුලත් ඇසුරුම් තුලට සැබැවින් කළු පැහැති දියරයක් ඇතුලත් කොට තිබුණේද? එසේ නම් ඒවා ඇතුලත් කරන්නට ඇත්තේ කෙසේ ද? එම දියරය ඇතුලත් කළා නම් එසේ ඇතුලත් කරන්නට ඇත්තේ කවුරුන් විසින්ද? එම කළු දියරය ඇති බව අදාල නිලධාරින්ට අනාවරණය වූයේ කෙසේ ද? කළු දියරයක් ඇතුලත් සිරිංජයක් සොයා කරන ලද කණ්ඩායම් පරීක්ෂණයේ දී කිසිවක් ඇතුලේ තිබුණු බවක් නොකියැවෙන හිස් සිරිංජයක් සොයා ගැනීමෙන් අනුපමේය වන කාරණය කවරක් ද ? තාක්ෂණික පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද සිරිංජය තුල කළු කුඩු වර්ගයක් තිබුණ බවට ITI ආයතනය විසින් ලබාදෙන ලද පරීක්ෂණ සහතිකයෙහි ඇති සඳහනෙන් පැනනගින අනුපමේය කවරක් ද? එදිනෙදා තමාගේ සේවා කටයුතු සඳහා අවශ්‍ය නොවන සිරිංජයක් වැනි භාණ්ඩයක් චන්දන සේවා ස්ථානය ඇතුලට ගෙන ආවේ ද? එය කළ හැකි දෙයක් ද? අනෙක් අතර එබන්දක් ආයතනය ඇතුලට ගෙන ඒමට සිතීම පවා අවදානමක් නොවේ ද? සැබැවින් චන්දන මෙම කළු දියරය නිමි භාණ්ඩ ඇසුරුම් තුලට විද්දා දැයි සැකයකින් තොරව නිගමනය කිරීමට තරම් සාක්ෂි තිබේ ද? ආදී ප්‍රශ්න වැලක් මෙහිදී මතු වෙයි.

සේවායෝජක ආයතනය පරීක්ෂණය පුරාවටම දැඩි ලෙස කියා සිටින්නේ ඉතාමත් ගුණාත්මක ප්‍රමිතීන් සහතික කළ යුතු ඇණවුමක් සඳහා සැපයුම් කරමින් සිටිය දී අසුරණ ලද පෙට්ටි තුලට කළු දියරයක් ඇතුලත් කිරීම කිසිසේත් ඉවසිය නොහැකි බලවත් කඩාකප්පල්කාරී ක්‍රියාවක් බවත්, එය කිසියම් සේවකයෙකු විසින් සිදු කරන ලද්දේ නම් එය බරපතල විෂමාචාරයක් බවත් ය. එසේ කළු දියරයක් තිබුණු බවට අනාවරණය වූ විට ඒ පිළිබඳව පරීක්ෂා නොකොට නිසි පියවර නොගෙන සිටීමට ආයතනයට කිසි සේත් හැකියාවක් නොමැත. ඒ නිසා එම කඩාකප්පල්කාරී ක්‍රියාවට වගකිව යුතු පුද්ගලයින් සොයා නිසි පියවර ගැනීම ආයතනය විසින් සිදු කරනු ලැබුවේ නම් තරාතිරම කුමක් වුවත් ඔහුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. මේ ස්ථාවරයන් දෙවන පාර්ශවයේ අවසාන ලිඛිත සැළකිරීම්වල අංක 69 සිට 73 සහ 98 ඡේද වලදී ඉතා බලවත් ලෙස කරුණු දක්වමින් පෙන්වා දී ඇත. මෙම සේවායතනය ජාතික සහ ජාත්‍යන්තර කීර්තියක් දිනාගෙන සිටින වැදගත් පෞද්ගලික සමාගමක් වන අතර බොරු චෝදනාවක් ගොතා සේවකයෙකු ඉවත් කිරීමේ බාල වැයමක නොයෙදෙන බවත් එවැනි ඇඟවීමක්වත් කරන්නේ නම් එය අපහාසයක් වන බව කියා සිටී. වැඩ වර්ජනයක් කරවාගෙන තම ආයතනයේ කටයුතු ඇනහිටින තත්ත්වයකට ඇද දැමීමට තම ආයතනයේ කළමනාකාරිත්වය කිසිසේත් ඉඩක් සළසන්නේ නැත්තේ ඉන් අත්වන පාඩුවේ බරපතලකම ගැන මනා අවබෝධයක් ඇති හෙයිනි. මෙම වැඩ වර්ජනයෙන් සිදු වූ

බරපතල පාඩුව සහ ඉන් සිදු වූ අගතිය දෙවන පාර්ශ්වයේ ලිඛිත සැළකිරීම් අංක 52 ඡේදයේ පැහැදිළිව සම්පිණ්ඩනය කර ඇත. ඒ නිසා චන්ද්‍රන නමැත්තාට එරෙහිව බොරු චෝදනාවක් නගා ඔහු ඉවත් කොට අනවශ්‍ය කාර්මික ආරවුලක් උපචිත කරවා ගැනීමේ අවශ්‍යතාවක් ආයතනයේ කළමනාකාරිත්වයට තිබුණේ නැති බව වැඩිදුරටත් ඔවුන්ගේ ස්ථාවරය වේ.

කෙසේ වෙතත් වෘත්තිය සමිතිය වෙනුවෙන් දක්වන ලද කරුණුවල දීත්, මෙහෙයවන සාක්ෂි වලදීත් පෙන්නුම් කරන්නට උත්සාහ ගෙන ඇත්තේ චන්ද්‍රන නමැති වෘත්තිය සමිති ක්‍රියාකාරකයා කළමනාකාරිත්වයටත්, විශේෂයෙන් ම එහි සාමාන්‍යාධිකාරිවරයාටත් හිසරදයක් ව පැවති නිසා ඔහු ඉවත් කරවා ගැනීමේ අභිලාශයක් ඔවුනට තිබුණු බවයි. චන්ද්‍රන විසින් A3249 දරන බේරුම්කරණ විභාග යේ දී දෙන ලද සාක්ෂි සහ මෙම විභාගයේ දී දෙන ලද සාක්ෂි අතර පරස්පරතා ඇති බව හුවා දක්වමින් දෙවන පාර්ශ්වය චන්ද්‍රනගේ සාක්ෂියේ විශ්වසනීයභාවයට අභියෝග එල්ල කළත්, මෙම පරීක්ෂණයේ 2017.06.01 දින සාක්ෂි දෙමින් චන්ද්‍රන කියා සිටියේ සාමුහික ගිවිසුමක් අත්සන් කිරීම පිළිබඳ කොන්දේසි පැනවීම, කොන්ත්‍රාත් සේවකයින් ශ්‍රම බලකා (Manpower service) පදනම යටතේ බඳවා ගැනීමට කළමනාකාරිත්වය ගත් උත්සාහයන්, වෘත්තිය සමිති රැස්වීම්වලට සහභාගි වීම අවහිර කිරීම වැනි කරුණු මත වෘත්තිය සමිති ශාඛාවත්, තමාත් සමග කළමනාකාරිත්වයේ ගැටුම් පැවති බවයි. කෙසේ වෙතත් දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැළකිරීම් වල 82 ඡේදයේ දී ආයතනයේ වෘත්තීය සමිති ශාඛාවේ කටයුතුවලට බාධා පැමිණවීමේ කිසිදු වුවමනාවක් එහි කළමනාකාරිත්වයට නොතිබුණු බව දක්වා ඇත. හිසරදයක්ව පැවති චන්ද්‍රන මුල දී වරදානයන් ලබා දී අවනත කර ගැනීමට උත්සාහ ගත් බවටත්, එය අසාර්ථක වූ විට ඔහු ඉවත්කර දැමීමට පාලනාධිකාරියට අවශ්‍යතාව මතුව තිබුණු බවටත් සමස්ත කරුණු විශ්ලේෂනය කිරීමේදී මට සෑහීමකට පත්වීමට හැකි විය.

තමාගේ ලොකරය තුල එවැනි සිරිංජයක් තිබීම ගැන කිසිදු දැනීමක් නොතිබුණු බව ලොකරය පරීක්ෂා කර සිරිංජය එළියට ගැනීමෙන් පසුව චන්ද්‍රන ලබාදුන් තම මුල් ප්‍රකාශයේ දී ද කියා සිටී ඇති අතර පරීක්ෂණයේ සාක්ෂි දෙමින් ද කියා සිටී. පරීක්ෂකයින් විසින් තම ලොකරයෙන් සිරිංජයක් එළියට ගත් බව චන්ද්‍රන ප්‍රතික්ෂේප නොකරන නමුත් එය තමා පළමු වරට දැක්කේ ද එම අවස්ථාවේදී ම බව කියා සිටී. තවද එම ලොකරය තමාට ආයතනයේ පරිපාලනයෙන් ලබා දුන් එකක් නොවන බවත්, ඊට වසර තුනකට පමණ පෙර ආයතනය හැර ගිය අනිල් නමැති සේවකයාගෙන් එක් යතුරක් පමණක් සමග තමා ලබාගත් එකක් බවත්, මාල දෙකක් තිබුණු එම ලොකරයේ තම ඇඳුම් පැළඳුම් ආදි දේ එහි ඉහළ මාලයේ තබාගත් අතර බිම් මට්ටමේ පහළ මාලය පාවිච්චි කළේ පාවහන් තැබීමට පමණක් බවත් චන්ද්‍රන සාක්ෂිවල දී කියා සිටියේ ය.

මෙම සිරිංජය කටුවක් රහිත හිස් සිරිංජයක් බව දෙපාර්ශ්වය ම ඉදිරිපත් කළ බොහෝ ලේඛන වල සඳහන් වේ. වැඩ වර්ජනය පවතිද්දී මේ සිද්ධියට අදාලව කොළඹ දිසා අධිකරණයේ සේවායෝජක ආයතනය විසින් පවරා ඇති නඩුවේ දෙවන පාර්ශ්වය විසින්ම ගොනු කර ඇති පැමිණිල්ලේ 03 වැනි පිටුවේ 10 වැනි ඡේදයේ පවා සඳහන් කර ඇත්තේ එය හිස් සිරිංජයක් බවයි. ලොකර පරීක්ෂාවේ යෙදුණු කිසිවෙකු ද එම කටුවක් රහිත සිරිංජය තුල කළු දියරයක් හෝ වියළි කළු කුඩු විශේෂයක් ඇති බවට කිසිවක් ඔවුන්ගේ ප්‍රකාශ කිසිවක කියා නැත. කෙසේ වුවත් සිරිංජය සහ කළු දියර ඇතුලත් කරනු ලැබූ රබර් ඇසුරුම් සාම්පල සසඳා ITI ආයතනය විසින් පරීක්ෂාවට ලක් කොට එවනු ලැබූ මෙ බේරුම්කරණ විභාගයේ දී X5, X5a, සහ X5b යනුවෙන් ලකුණු කළ ලේඛනයේ Identification of Test Item යන ශීර්ෂය යටතේ සඳහන් වන්නේ එම ආයතනය විසින් පරීක්ෂණයට භාජනය කළ සිරිංජය තුල කළු පැහැති කුඩු වර්ගයක් අන්තර්ගත වී ඇති බවයි. උද්ධෘතය : *"Sample 1 - Syringe contaminated with black coloured dust, contained in polythene bags"* මෙහිදී ''හිස් සිරිංජයක්'' යන්න පිළිබඳ ව දෙවන පාර්ශ්වය ඔවුන්ගේ අවසන් ලිඛිත සැළකිරීම් වල 62f හි කර ඇති පැහැදිළි කිරීම පිළිබඳව ද මම අවධානය යොමු කළෙමි.

මෙම සිරිංජය සොයාගත් පරීක්ෂණ මණ්ඩලය කළමනාකාරිත්වයේ උපදෙස් පරිදි මුද්‍රා තබා භාර දුන් බවත්, එය ප්‍රධාන කාර්යාලයට යවනු ලැබ තාක්ෂණික පරීක්ෂණය සඳහා ITI ආයතනයට යැවූ බවත් දෙවන පාර්ශ්වයේ සාක්ෂිවලින් කියැවුණි. කෙසේ නමුත් එම මුද්‍රිත පාර්සලය ප්‍රධාන කාර්යාලයට ලැබුණු පසු ව විවෘත කිරීමකට භාජනය කෙරුණු බවට කරුණු සාක්ෂි විභාගයේ දී හෙළ විය. අනෙක් අතට මේ සාම්පල පරීක්ෂණය සඳහා ITI ආයතනයට ඉදිරිපත් කොට ඇත්තේ සේවායෝජක ආයතනය විසින් නොව වෙනත් තුන්වන පාර්ශ්වයක් විසිනි. එය ඉදිරිපත් කර ඇත්තේ Healthscan (Pvt) Ltd නමැති කොළඹ 08 ලිපිනයක ඇති පිටස්තර ආයතනයක් මගිනි. එම Healthscan (Pvt) Ltd ආයතනය සේවායෝජක ආයතනයේ සේවය කරන වෛද්‍යවරියකට අයත් එකක් බවද සාක්ෂි වලින් කියැවිණි. චන්ද්‍රන නමැත්තාගේ සේවය අත්හිටුවීම සහ අවසානයේ සේවය අවසන් කිරීමට පාදක වන මෙම පරීක්ෂණ වාර්තාව ලබාගැනීමේ දී අනුගමනය කර ඇති කාර්ය පටිපාටිය සහ පියවරයන්හි විනිවිද පෙනෙනභාවය ප්‍රශ්න සහගත බව නිරීක්ෂණය කරමි. එම තාක්ෂණික වාර්තාව ප්‍රශ්න කිරීමකින් තොර ව පිළිගත යුතු ලේඛනයක් වුවත් ගැටළුව පවතින්නේ එය ලබා ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටියේ යම් අඩුපාඩු සිදුවී ඇත්ද යන්නයි.

සිරිංජය ඔහුගේ ලොකරයේ යට මාලයේ තිබී සොයා ගනු ලැබීම හැරුණුවිට චන්ද්‍රන විසින් එම ප්‍රශ්නගත කළු දියරය රබර් වළළු ඇසුරුම් තුලට ඇතුලත් කරනු කිසිවෙකු විසින් දැක ඇති බවක් පිළිබඳ වෙනත් කිසිදු සාක්ෂියක් මෙම පරීක්ෂණයේ දී ඉදිරිපත් වුනේ නැත. ඒ වෙනුවට ආයතනය වෙනුවෙන් සාක්ෂි දුන් කළමනාකරු (කාර්මික සබඳතා) මොහාන් පීරිස් මහතා ද කියා සිටියේ චන්ද්‍රන විසින් කළු දියරයක් ඇතුලත් කරනු කිසිවෙකු දැක නැති බවයි. ඒවා අපනයනයට සූදානම් කොට තැබූ ස්ථානය ගැන කරන ලද විස්තරය දෙස සැළකිල්ල යොමු කළහොත් මෙපමණ සේවක සංඛ්‍යාවක් සහ ආරක්ෂක කාර්ය මණ්ඩලයක් සිටින තැනක එවැනි කඩාකප්පල්කාරී ක්‍රියාවක්, කවුරුත් හොඳින් දන්නා හඳුනන, දහවල් වැඩමුරයේ පමණක් සේවය කළ චන්ද්‍රන වැනි කෙනෙකුට වෙනත් කිසිවෙකුට හසු නොවී කළ හැකි ද යන්න ද ප්‍රශ්නගත කරුණකි.

චන්දන මෙම කඩාකප්පල්කාරී ක්‍රියාව සිදු කළේද යන්න සැබවින් ම තීරණය කරගත හැකිව තිබුණේ අපරාධ පරීක්ෂකයෙකුගේ දැඩි විමර්ශනයකින් පසුව ය. එබඳු අපරාධයක් විමර්ශනය සිදු කරන නිලධාරියෙකු විසින් ගතහැකි ක්‍රියාමාර්ග අවුරුදු 10කට වඩා පැරණි සිද්ධියක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේ දී සිදු කිරීම මගේ පාලනයෙන් බාහිර කාර්යයකි. එම නිසා මා වෙත ඉදිරිපත් වූ කරුණු සියල්ල මැදහත් ව විශ්ලේශනය කිරීමෙන් පසු මා නිගමනය කරන්නේ එකී කඩාකප්පල්කාරී ක්‍රියාව එච්. ඒ. කේ. චන්දන නමැති සේවකයා විසින් ම සිදු කරන ලදැයි යන්න සාධාරණ සැකයකින් තොරව පිළිගත නොහැකි බවයි.

ඒ නිසා සේවායෝජක ආයතනයේ CMU වෘත්තීය සමිති ශාඛාව සහ මව් සංගමය සහ වැඩ වර්ජනයේ නියැලුණු සේවකයින්ගේ ස්ථාවරය වූ ''චන්දනට එරෙහිව පදනම් විරහිත චෝදනාවක්'' නගා ඒ මත ඔහුගේ සේවය අත්හිටවූයේ ය යන්නට එකඟ වීමට මට සිදු වේ.

**සේවකයින් 159 දෙනා සහභාගි වූ වැඩ වර්ජනය සාධාරණ ද? නීත්‍යානුකුල ද?**

ඉහත නිගමනයට එළඹෙන්නේ නම්, එම පසුබිම තත් ආකාරයෙන් දන්නා ශාඛා වෘත්තිය සමිතියේ සාමාජිකයින් තමන් වෙනුවෙන් වෘත්තිය ප්‍රශ්න වල දී පෙනී සිටිමින්, නොයෙකුත් දුෂ්කරතා මැද, කැප වීමකින් කටයුතු කරමින් සිටි තම වෘත්තිය සමිති ශාඛාවේ සමලේකම් තනතුර හොබවමින් එහි ඉදිරිපෙළ නායකත්වයේ සිටි තැනැත්තාගේ සේවය කළමනාකාරිත්වය විසින් අත්හිටවනු ලැබීම අසාධාරණ ක්‍රියාවක් ලෙස සළකා ඊට එරෙහි ව වෘත්තිය ක්‍රියාමාර්ගයක් ගැනීම අසාධාරණ යයි මම නොසිතමි.

මෙහි දී සේවා යෝජක පක්ෂය කියා සිටින්නේ මෙම සේවකයින් විසින් වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවේ චන්දන නමැත්තාගේ සේවය අවසන් කිරීමේ හේතුවක් නිසා නොවන බවයි. ඉහතින් විස්තර කරන ලද කඩාකප්පල්කාරී ක්‍රියාව සම්බන්ධයෙන් ඇති වූ සාධාරණ සැකය මත තරාතිරම නොබලා චන්දන නමැති සේවකයාගේ සේවය වැටුප් නොගෙවන පදනම යටතේ අත්හිටුවා විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇත. විෂමාචාරයක් පිළිබඳ යම් සැකයක් පහළ වූ විටෙක අදාල සේවකයාට එරෙහිව විනය ක්‍රියාමාර්ග යක් ගැනීමට සේවායෝජකයෙකුට අනන්‍ය අයිතියක් ඇත. වැඩ වර්ජනය ආරම්භ කරන අවස්ථාව වනවිට චන්දනගේ සේවය අවසන් කර නොමැති අතර හුදෙක් ම සිදු කරනු ලැබ ඇත්තේ 2007.10.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි විනය පරීක්ෂණයකට යටත්ව වැටුප් රහිතව සේවය අත්හිටුවීම පමණි. සේවකයෙකුගේ සේවය විනය හේතු මත, විනය පරීක්ෂණයකට මුල පිරීමක් වශයෙන් අත්හිටවීම වළකා හරිමින් චෝදනාවට ලක් වූ සේවකයා නැවත සේවයේ පිහිටුවන්නැයි වෘත්තිය ක්‍රියාමාර්ගයන්ට එළඹීම නීතිවිරෝධී ක්‍රියාවක් ලෙස සේවායෝජක පක්ෂය පෙන්වා දෙයි. දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැළකිරීම්වල අංක 98 සිට 102 දක්වා ඡේදවල එම කාරණය ඉතා තාර්කික ව අවධාරණය කර ඇත.

මෙහි දී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් වන්නේ වැඩ වර්ජන තීරණ ගන්නා වෘත්තිය සමිති මව් සංගමය හැම විටම කියා ඇත්තේ වැටුප් රහිත ව සේවය අත්හිටවා ඇති චන්දන හිඟ වැටුප් සමග සේවයේ පිහිටවී ම ය. විනය පරීක්ෂණයක් පැවැත්වීම අත්හිටවීමට ඉල්ලීමක් කරන බවක් ඒවායින් නොකියැවේ. වැඩ වර්ජනය කිරීමට වෘත්තිය සමිතිය පෙළඹ වූ උත්සන්න තත්ත්වය උදා වී ඇත්තේ A18 සහ X6 ලෙස ලකුණු කොට ඉදිරිපත් කළ චන්දනට එරෙහි ව නිකුත් කළ චෝදනා පත්‍රයේ අඩංගු චෝදනාවන් ය. වෘත්තිය සමිති මව් සංගමයේ ලේකම් අවධාරණය කර ඇත්තේ එම චෝදනාවන් හුදු පදනම් විරහිත සිතාගැනීම් පදනම් කරගෙන නගා ඇති ඒවා බවය. පළමුවැනි පාර්ශවය විසින් මෙම බේරුම්කරණ විභාගයේ දී සාක්ෂි මෙහයවීම මගිනුත්, තම අවසන් ලිඛිත සැළකිරීම්වල 6.34 යටතේ සම්පිණ්ඩනය කර ඉදිරිපත් කර ඇති කරුණුත් මගින් එය පැහැදිලි වේ. චෝදනා පත්‍රයේ ප්‍රධාන චෝදනා 4 පහත දැක්වේ:

1. කළමනාකාරිත්වයේ නිෂ්පාදන ක්‍රියාවලියට කිසිසේත්ම අවශ්‍ය නොවන සිලිංජරයක් සමාගමේ පරිශ්‍රය තුළට අනවසරයෙන් ගෙන ඒම.

2. එසේ අනවසරයෙන් ගෙනෙන ලද හිස් සිලිංජරය ඔබ භාරයේ පමණක් සහ ඔබ සන්තකයේ යතුරු තිබුණු සේවකයින්ගේ පෞද්ගලික රෙදිපිළි සහ පෞද්ගලික භාණ්ඩ තබා ගැනීමට අවසරය තිබූ ඔබගේ පෞද්ගලික ලොකරයේ තබා ගැනීම.

3. සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලිය අවතක්සේරුවට ලක්කිරීමේ අරමුණෙන් කාඩ්බෝඩ් පෙට්ටියක් බෝතල් මූඩි සවිමත්ව වැසීමට භාවිතා කරන රිං අසුරන ලද පොලිතීන් බෑග් තුලට කාබන් අඩංගු ද්‍රාවනයක් මෙසේ අවසරයකින් තොරව රැගෙන එන ලද මෙම සිලිංජරය භාවිතයෙන් ඇතුල් කිරීම,

4. මෙසේ කාබන් දියර අඩංගු රිං අසුරන ලද පෙට්ටිය සොයාගැනීමෙන් එය සිලිංජරයක් භාවිතයෙන් ඇතුලත් කර ඇති බව පෙනී ගිය හෙයින්, කළමනාකාරිත්වයට පුළුල් පරීක්ෂණයක් කිරීමට සිදු වූ අතර, එම පරීක්ෂනයේදී ඔබගේ පෞද්ගලික ලොකරයේ තිබී මෙම සිලිංජරය සොයාගැනීමට හැකිවීම. (මෙහි දී සියළුම සේවකයින්ගේ ලොකර් පරීක්ෂාවට ලක් කරන ලදී.)

ඉතිරි චෝදනා හතර මෙකී ප්‍රධාන චෝදනා හතර නිසා පැන නගින ඒවා ය. පළමුවැනි පාර්ශ්වය ඉතා ප්‍රබල ලෙස හබ කරමින් කියා සිටින්නේ A21 සහ A23 ලෙස ලකුණු කළ ලිපි මගින් වෘත්තිය සමිතිය ඉහත කී චෝදනාවන් බැලූ බැල්මට සාක්ෂි මගින් ඔප්පු කිරීමට හැකි ඒවා නොවන බවත් පදනම් විරහිත ව නගා ඇති ඒවා බවත් වැඩවර්ජන ක්‍රියාමාර්ගයකට එළඹීමට පෙර කළමනාකාරිත්වයට

දනුම් දුන් බවයි. පරීක්ෂණයේ දී මෙහෙයවන ලද සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දී මා නිරීක්ෂණය කළේ චන්දනගේ ලොකරයේ තිබී කටුවක් නැති සහ කිසිවක් අඩංගු නැති හිස් සිරිංජරයක් හමුවීම හැරුණු විට චන්දනට එරෙහි ඉහත සඳහන් කළ චෝදනා නැගීමට තරම් සාධක නොතිබුණු බවයි. එබඳු තත්ත්වයක් පවතිද්දී සාධාරණත්වයක් ඉටුකරවා ගැනීමට වෘත්තීය සමිති සාමාජිකයින් වෘත්තිය ක්‍රියාමාර්ගයන්හි නියැලීම සාධාරණ බව මගේ හැඟීමයි.

මෙහි දී මෙම ක්‍රියාදාමය සිදු වූ කාල පරිමාව ද වැදගත් ය. කළු දියර සිද්ධිය අනාවරණය වී ඇත්තේත්, චන්දනගේ ලොකරය තුළ තිබුණේ යයි කියන සිරිංජරය සොයා ගෙන ඇත්තේත් 2007.10.26 දින දී ය. ඔහුගේ සේවය 2007.10.29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් රහිත ව අත්හිටුවන ලද ලිපිය 2007.10.31 දින භාර දෙනු ලැබ ඇත. වෘත්තිය සිමිති ශාඛාවේ නිලධාරිනුත්, මවු සංගමයේ නිලධාරිනුත් කළමනාකාරිත්වය සමග විසඳුමක් සඳහා සාකච්ඡා සහ ලිපිහුවමාරු කිරීම් ගණනාවක් කර ඇති අතර විනය ක්‍රියාමාර්ගය ආරම්භ කිරීමක් ලෙස චෝදනා පත්‍රයක් චන්දනට ලියාපදිංචි තැපෑලෙන් යවා ඇත්තේ 2007.12.11 වැනි දින දී ය. චන්දන විසින් එකී චෝදනා පත්‍රයට පිළිතුරු 2007.11.19 වැනි දිනෙන් යවා ඇත. මෙම ගැටළුව දැවැන්ත කාර්මික ආරවුලක් බවට පත්වීම වැළැක්වීම සඳහා දෙවන පාර්ශ්වය විසින් මීට වඩා සාධනීය පියවරක් ගත හැකිව තිබුණේ යයි මම සිතමි.

ශාඛා සංගමය වැඩ වර්ජනයක් සිදු කරනු ලබන බවට කරනු ලැබූ දැනුම් දීම ප්‍රමානවත් කාලයක් ලබාදෙමින් සිදු කර නැති නිසා එම වැඩ වර්ජනය නීති විරෝධී සහ අසාධාරණ එකක් බවට දෙවන පාර්ශ්වය නඩු තීන්දු ද ගෙනහැර දක්වමින් ඉතා තියුණු ලෙස තර්ක කොට ඇත. දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැළකිරීම් වල 44 වැනි ඡේදය ප්‍රකාර ව X23 ලෙස ලකුණු කළ 2007.12.24 දිනැති වෘත්තිය සමිති මවු සංගමයේ ප්‍රධාන ලේකම්ගේ අත්සනින් යුතුව එවන ලද වැඩ වර්ජන නිවේදනය ඇතුළත් ලිපිය සේවායෝජක ආයතනයට ලැබී ඇත්තේ 2007.12.27 වැනි දින දී ය. එම ලිපියේ සඳහන් වන්නේ 2007.12.24 වැනි දිනෙන් දින හතක් ඇතුලත මෙම ප්‍රශ්නය නිරාකරණය නොවුනහොත් වැඩ වර්ජන ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා ශාඛා සමිතියට බලය ලබාදෙන ලබයි. එසේ ලිපියක් යවනු ලැබ, එම ලිපියට කළමනාකාරිත්වයෙන් පිළිතුරක් (X24) යවා තිබිය දී 2007.12.28 වැනි දින නිසි කල් දීමකින් තොරව වැඩ වර්ජනය ආරම්භ කර තිබීම නිසා එය නීති විරෝධී සහ අසාධාරණ එකක් බවට දෙවන පාර්ශ්වය විසින් තදබල ලෙස අවධාරණය කර ඇත. මේ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැලකිරීම් වල අංක 3.1 සිට 3.8 දක්වා ඡේද වල දක්වා ඇති කරුණු ද මගේ අවධානයට ලක් කෙරුණි. 23 ලිපිය මගින් වෘත්තිය සමිති මව් සංගමයේ ප්‍රධාන ලේකම් වැඩ වර්ජනයේ සම්පූර්ණ වගකීම භාර ගෙන ඇති අතර, වැඩ වර්ජනයක් සිදුකරන බවට තමා ආයතනයේ සමූහ මානව සම්පත් ප්‍රධානීට දුරකතනයෙන් දැනුම් දුන් බව සඳහන් කරයි. එකී ලිපියේ අන්තර්ගතය කළමනාකාරිත්වයෙන් ප්‍රතික්ෂේප කළ බවක් ද පෙනෙන්නට නැත.

වැඩ වර්ජනයක් දියත් කිරීමේදී සාධාරණ කාලයක පූර්ව දැනුම් දීමක් දැනට පවත්නා සාමාන්‍ය තත්ත්වයකි. කෙසේ වුවත් අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස කම්කරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන කර්මාන්තයක වෘත්තිය සමිතියකට වැඩ වර්ජනයක් දියත් කිරීමේ දී දින 21කට පෙර ලිඛිත දැනුම් දීමේ අවශ්‍යතාව පිළිබඳ විධිවිධානයන් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 32(2) වගන්තියේ ඇතුලත් වීම හැරුණු විට වැඩ වර්ජනයක් සිදු කිරීමේදී වෘත්තිය සමිතියක් වැඩ වර්ජනයක් ආරම්භ කිරීමේ දී නිශ්චිත කාලයකට පෙර නිල දැනුම් දීමක් කළ යුතු ය යන නීතිමය අවශ්‍යතාවක් ගැන මම නොදනිමි. මෙහි සැළකිල්ලට භාජනය වන වැඩ වර්ජනය සේවකයින් කීප දෙනෙකුගේ අභිලාශයන් මුදුන්පත් කරගැනීම උදෙසා සිදු කරන ලද්දක් නොවන අතර මවු සංගමයේ අනුමැතිය ද ඇතිව ශාඛා වෘත්තිය සමිතිය මගින් දියත් කරන ලද අනුමත වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයකි. මෙහි සේවායෝජක ආයතනයට අදාල කර්මාන්තය අත්‍යාවශ්‍ය කර්මාන්තයක් ලෙස කම්කරු අමාත්‍යවරයා විසින් නියම කරන ලද්දක් ද නොවේ. කාර්මික ආරවුල් පනතේ 32 අ වගන්තිය ප්‍රකාරව වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක නියැලීම එකම හේතුව මත සේවකයින්ගේ සේවය අවසන් කිරීම නීති විරෝධී ක්‍රියාවක් වනු ඇත. තව ද වැඩවර්ජනය කිරීමේ නිවේදනය සේවා යෝජනයා වෙත නිල වශයෙන් ලඟාවීම අවසාන මොහොතේ දී සිදු වී ඇති බව මෙහි දී පෙනී යන සත්‍යයක් වුව ද, 2007.12.28 වැනි දින වකවානුව වන විට චන්දන නමැති වෘත්තිය සමිති ක්‍රියාකාරකයාගේ වැඩ නැවැත්වීමට එරෙහිව පැන නැගෙමින් තිබුණු සේවක නැගිටීමේ ස්වභාවය, කළමනාකාරිත්වය සහ වෘත්තිය සමිති නියෝජිතයන් අතර පවත්වා ඇති සාකච්ඡා, හුවමාරු වී ඇති ලිපි ආදියෙන් සේවායෝජකගේ නම්‍යශීලි නොවන චර්යාව පිළිබඳ නොසතුටට සහ අසහනයට පත්ව සිටි සේවක පිරිස් වැඩ වර්ජනයක් වැනි දැඩි වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට එළඹීමට ඇති ආසන්නතම අවකාශය සේවායෝජකයාට විශ්මය ගෙන දෙන ආරංචියක් විය නොහැකි ය.

එම නිසා සේවකයින් විසින් දියත් කරන ලද මෙහි සැළකිල්ලට භාජනය වන වැඩ වර්ජනය ඔවුන් විසින් ගන්නා ලද අනෙක් උත්සාහයන් නිශ්ඵල වීමේ හේතුවෙන් ගන්නා ලද අවසාන වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය බව මට පෙනී යන අතර එකී වැඩ වර්ජනය නීති විරෝධී හෝ අසාධාරණ ක්‍රියාවක් යයි මම නිගමනය නොකරමි.

වැඩ වර්ජකයින්ගේ නොමනා ක්‍රියාකලාපයන් :

2007.12.28 වැනි දින වෘත්තිය සමිතිය දියත් කළ වැඩ වර්ජනයට සහභාගි වූ සේවකයින් ඉතා නරක හැසිරීම්වලින් යුතුව ක්‍රියා කළ බවට දෙවන පාර්ශ්වයෙන් බෙහෙවින් කරුණු ඉදිරිපත් විය. වැඩට එන සේවකයින්ට සේවයට වාර්තා කිරීම අවහිර කිරීම, පරුෂ වචනයෙන් සහ නොයෙකුත් අවලාදවලින් ඔවුන්ට නින්දා කිරීම, සේවායෝජක ආයතනයේ සාමාන්‍යාධිකාරී ඇතුලු පිරිසට අපහාස වන කියමන් සහ බැනර් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම, පහර දීම් සිදුකිරීම වැනි ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව දැඩි දෝෂ දර්ශනයක් වර්ජකයින් වෙත එල්ල කෙරුණි. X31 දිට X38 දක්වා දෙවන පාර්ශ්වයෙන් ලකුණු කළ ලේඛන උපයෝගි කරගෙන එම සිද්ධීන් පිළිබඳ ව සාක්ෂි මෙහෙවන ලදී. දෙවන පාර්ශ්වය මේ මගින් අවධාරණය කිරීමට වෑයම් කළේ වැඩ වර්ජනයේ යෙදී සිටිය දී ප්‍රචණ්ඩ ව සහ අවිනීත ව

හැසුරුණු මෙම වැඩ වර්ජකයින් නැවත සේවයට බඳවා ගැනීම ආයතනයේ ගෞරවයට හානියක් බවයි. පළමුවන පාර්ශ්වය පෙන්වා දුන් කරුණු ද සැළකිල්ලට ගන්නා ලදී. ඉදිරිපත් වූ කාරණා විශ්ලේශනය කර බැලූ විට පෙනී යන්නේ වැඩ වර්ජනයේ මුල් දින කීපයේ තිබී ඇත්තේ සාමාන්‍ය වශයෙන් වැඩ වර්ජකයින් කණ්ඩායමක් ලෙස ඒකරාශි වී අරගලයක් කරන අවස්ථාවක සුලභ ව දකින්නට ලැබෙන දේවල් ය. යම් යම් අවිනීත මට්ටමේ යයි කිව හැකි සිද්ධීන් වැඩි වශයෙන් ඇති වූ බව පෙනී යන්නේ වැඩ වර්ජකයින්ගේ රැකියාව අහිමි වීමෙන් පසු ව බවයි.

වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක දී අනිසි හැසිරීම් සිදු කිරීම හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත වීම කිසි සේත් අනුමත කළ නොහැකි බව අවධාරණය කරන නමුත් එසේ වූ වැඩ වර්ජකයින්ගේ හැසිරීම් ඔවුන්ගේ රැකියාවන් අහිමි කිරීමට පදනමක් කර ගැනීමට සුදුසු නොවන බව මගේ තීරණයයි.

**අභියාචනාධිකරණයේ විනිශ්චයට භාජනය වී ඇති 119/2012 දරන නඩුවේ බලපෑම :**

ඉහතින් ද සඳහන් කළ 3249 දරන බේරුම්කරණ ප්‍රදානය අභියෝගයට ලක් කරමින් දෙවන පාර්ශ්වයේ සේවායෝජක ආයතනය අභියාචනාධිකරණයේ 119/2012 දරන නඩුව පැමිණිලි කොට ඇති අතර එය විභාග වෙමින් පවතින්නක් බව මෙම බේරුම්කරණ විභාගයේ යම් යම් අවස්ථාවල දී සඳහන් විය. එම නඩුව මගින් සේවා යෝජක ආයතනය අභියාචනාධිකරණයෙන් ඉල්ලා ඇත්තේ එච්. ඒ. කේ. චන්දන නමැත්තාගේ සේවය අවසන් කිරීම නීති විරෝධී බවට තීරණය කරමින් එකී A 3249 බේරුම්කරණ විභාගයේ දී ඇති ප්‍රදානය බලරහිත කරන ලෙසයි.

අභියාචනාධිකරණයේ විභාග වන එකී නඩුව මෙම බේරුම්කරණ පරීක්ෂණයේ දී ප්‍රධාන වශයෙන් මතු වුණේ එකී A3249 දරන බේරුම්කරණ විභාගයේ දී මෙහෙයවන ලද ඇතැම් සාක්ෂි අඩංගු කාර්ය සටහන් මෙම පරීක්ෂණයේදී වැදගත් සාක්ෂි වශයෙන් පිළිගැනීමට හැකි ද යන ප්‍රශ්නය උඩයි. ඒ සම්බන්ධයෙන් ගෙන එන ලද මූලික විරෝධතාවන් පිළිබඳ ව දෙපාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද ලිඛිත සැළකිරීම් සැළකිල්ලට භාජනය කොට මා විසින් ඒ ඒ අවස්ථාවන්හි දී තීරණයන් ලබා දී ඇත. විභාගය පැවැත්වෙන අවස්ථාවල දී පළමුවැනි පාර්ශ්වය ලකුණු කළ එබඳු ලේඛන කීපයක් දෙවන පාර්ශ්වය විසින් ඔප්පු කිරීමේ භාරයට යටත් කරනු ලැබුවද, පසුව ඒවායේ ඔප්පු කිරීමේ භාරයට යටත් කිරීමේ අවශ්‍යතාව ඉවත් කළ අතර, එම ලේඛනවල අන්තර්ගතය පිළිබඳ ව අවසන් ලිඛිත සැළකිරීම්වල දී කරුණු කීමේ අයිතිය රඳවා ගත්තේය.

ඒ හැරුණු විට එකී 119/2012 දරන අභියාචනාධිකරණයේ පැවැත්වෙන නඩුව හේතු කොට ගෙන මෙම බේරුම්කරණ විභාගය නොපැවැත්විය යුතු බවට එක් පාර්ශ්වයක් වත් විරෝධතාවක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටියේ නැත. එකී අභියාචනාධිකරණ නඩුව විභාග වන බැවින් එහි අවසාන තීන්දුවක් දෙන තෙක් මෙම බේරුම්කරණ විභාගය අත්හිටවන්නට එකද පාර්ශ්වයක් වත් ඉල්ලීමක් ද කළේ නැත. තවදුරටත් විනිශ්චයට භාජනය වී ඇති නඩු නිමිත්තක් යයි මෙම බේරුම්කරණ විභාගය අත්හිටවීමට අතුරු තහනම් නියෝගයක් අවශ්‍ය නම් ගෙන ඒමට පාර්ශ්වකරුවන්ට ඕනෑතරම් ඉඩ තිබුණි. එවැනි කිසිවක් මෙම විභාගය පැවැත්වුණු වසර පහක පමණ කාලය තුළදී සිදු නොවුණු නිසා මෙම බේරුම්කරණ විභාගය අමාත්‍යවරයාගේ අදාල යොමුවට අනුගතව පවත්වාගෙන යාමෙන් වැළකීමට මට හැකියාවක් නොවීය.

**වන්දි ගෙවීමට සම්බන්ධ කාරණා :**

යම් හෙයකින් මෙම ප්‍රදානයේ දී සේවය අවසන් කරනු ලැබූ සේවකයින්ට වන්දි ගෙවීමට නියෝගයක් කරනු ලැබුවහොත් එය අතිවිශාල මුදලක් වන බවත්, එබඳු මුදලක් ගෙවීමට ආයතනයේ මුදල් ශක්තිය ඉඩ නොදෙන බවත් තහවුරු කිරීමට දෙවන පාර්ශ්වය එහි මූල්‍ය කළමනාකාරිනි පාලිකා චන්ද්‍රජීව මහත්මියගේ සාක්ෂි මෙහෙයවීම යටතේ X46 සිට X49 දක්වා ලකුණු කොට ඉදිරිපත් කළ ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ආදී ලේඛන රැසක් බේරුම්කරණයේ අවධානයට ලක් කරන ලදී.

කිසියම් වන්දියක් ගෙවීමට තීරණය කිරීමට නම් සිදුවූ නිශ්චිත හානියක් ගණනය කිරීම අත්‍යවශ්‍ය වන බවට විනිශ්චිත නඩු තීන්දු ද ගෙනහැර දක්වමින් දෙවන පාර්ශ්වය විසින් ඉතා වැදගත් නීති තර්ක ඉදිරිපත් කර ඇත. එසේ මෙහි සේවය අවසන් කරනු ලැබූ සේවකයින්ට අත්විඳින්නට සිදුවූ නිශ්චිත හානියක් ගණනය කර දක්වා නැති නිසා ඔවුන්ට එවැනි වන්දි ගෙවීමට ඉඩක් නොමැති බවට දෙවැනි පාර්ශ්වය සිය අවසන් ලිඛිත සැළකිරීම් වල 84 සිට 93 දක්වා ඡේද වල සියුම්ව කරුණු දක්වා ඇත.

**සහනයන් ඉල්ලීම :**

මෙම සේවකයින්ට සාධාරණයක් සැළසීම අවශ්‍ය බවට බේරුම්කරු නිගමනයකට එළඹෙන්නේ නම් පළමුවන පාර්ශ්වයට ලබාදිය යුතු සහනයන් ලෙස ඉල්ලා සිටින්නේ :

1. වැඩ වර්ජනය කිරීමේ හේතුවෙන් සේවය අහිමි කරනු ලැබූ සේවකයින් 159 දෙනාම නැවත සේවයේ පිහිටුවීම, සහ

2. එකී සේවකයින්ට සේවය අහිමි වූ දින සිට නැවත සේවයේ පිහිටුවන දිනය තෙක් කාලයට හිඟ වැටුප්, සියලු වේතනාධික, අනෙකුත් දීමනා සහ සියලු ප්‍රතිලාභ ලබා දිය යුතු බවයි.

නිගමන :

වසර පහක පමණ කාලයක් තිස්සේ පවත්වාගෙන යනු ලැබූ මෙම බේරුම්කරණ විභාගයේ කාර්ය සටහන්වල ඇතුළත් දෙපාර්ශ්වය විසින් මෙහෙයවන ලද සාක්ෂි, විභාග පටිපාටිය ඇතුළත වරින් වර ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා සහ ඒවා සම්බන්ධයෙන් දෙපාර්ශ්වය තර්ක කරමින් ඉදිරිපත් කළ ලිඛිත සැළකිරීම් සහ ඒවා පිළිබඳ ව මවිසින් දෙනු ලැබූ තීරණයන්, දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද අවසන් ලිඛිත සැළකිරීම් සහ ඒවායේ ඉතාමත් සූක්ෂම ලෙස ඇති නීති තර්ක මෙන් ම ගෙන හැර දක්වා ඇති විනිශ්චිත නඩු තීන්දු ඉතා වෙහෙසක් දරා පරිශීලනය කළෙමි. එමෙන් ම පරීක්ෂණය පැවැත්වූ මා විනිශ්චය අධිකාරියක් වශයෙන් නිරීක්ෂණය කළ කරුණු සමග ඒ සියල්ල එක්කොට මෙම කාර්මික ආරවුලට අදාල සියලු කරුණු වල සමස්තභාවය මෙම ප්‍රදානය සකස් කිරීමේ දී මා පදනම් කරගත් බව සටහන් කරමි.

සියලු කරුණු මැදහත් ව සැලකීමෙන් පසු ව අමුණා ඇති ඇමුණුමෙහි සඳහන් සේවකයින් 159 දෙනා සහභාගි වූ වැඩ වර්ජනය සාධාරණ එකක් බවටත්, ඒ නිසා ඔවුන්ගේ සේවය අවසන් කිරීම යුක්ති සහගත නොවන බවටත් මම නිගමනය කරමි. ඒ නිසා එකී සේවය අවසන් කරනු ලැබූ සේවකයින්ට සහනයන් සැළසිය යුතු බව ද නිගමනය කරමි. මෙම බේරුම්කරණ විභාගයේ විශේෂ ස්වරූපයත්, එයට බද්ධ වී ඇති තද බල නීතිමය හබ කිරීම්වල බලපෑමත්. විභාගය සඳහා ගත වූ අසාමාන්‍ය කාලයත්, සේවකයින්ගේ සේවය අහිමි කරනු ලැබ මේ වන විට වසර 12කට වැඩි කාලයක් ගත වී ඇති බවත්, සලකා බලන විට සේවය අහිමි වූ සේවකයින්ට සහනයන් සැළසීමට නිර්දේශ ඉදිරිපත් කළ යුතු අතර ඉන් සේවායෝජකට අනිසි අසාධාරණයක් නොවන අයුරෙන් සිදු විය යුතු බවද මගේ නිගමනයයි.

මෙම ප්‍රදානය කරනු ලබන්නේ ඉහත නිරීක්ෂණ සහ නිගමන සැලකිල්ලට ගැනීමෙන් පසු එක් අතකින් නීතිය ද අනෙක් අතින් යුක්තිය සහ සාධාරණත්වය ද පදනම් කරගෙන ය.

ප්‍රදානය

1. මෙම ප්‍රදානයට අමුණා ඇති ලැයිස්තුවේ සඳහන් සේවය අහිමි කරන ලද සේවකයින් 159 දෙනාට රැකියාව ලබා දී, 2007.12.28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඔවුන් නැවත සේවයේ පිහිටවිය යුතු ය.

2. එසේ නැවත සේවයේ පිහිටුවනු ලබන සේවකයින්ට 2007.12.28 වැනි දින සිට නැවත සේවයේ පිහිටුවන දිනය දක්වා එක් එක් සේවකයාට පෞද්ගලික වන සේ ඔවුන් අවසන් වරට ලබමින් සිටි <u>මාසික මූලික වැටුප</u> (අනෙකුත් දීමනා ආදිය නොමැතිව) පදනම් කොට ගණනය කරනු ලබන හිඟ වැටුප් ලබා දිය යුතු ය.

3. ඉහත 2 වැනි ප්‍රදානයේ සඳහන් හිඟ වැටුප් 2007.12.28 වැනි දින සිට සේවයේ පිහිටුවන දිනය දක්වා කාලය ඇතුළත ආයතනයේ අනුමත විශ්‍රාම වයසට ළඟා වී ඇති සේවකයින් වෙතොත් ඔවුන් එසේ විශ්‍රාම ගිය දිනය දක්වාත්, මිය ගිය සේවකයින් වෙතොත් (ඔවුන් වෙනුවෙන් නීත්‍යානුකුල යැපෙන්නන්ට) එසේ මිය ගිය දිනය දක්වාත් කාලයට පමණක් ගෙවිය යුතු ය.

4. එසේ නැවත සේවයේ පිහිටුවනු ලබන සේවකයින් කිසිවෙකු වැඩ වර්ජනයට සහභාගි වීමේ හේතුව මත කිසිදු වෙනස්කමකට හෝ අගතියකට භාජනය නොකරනු ලැබිය යුතු ය.

5. එසේ නැවත සේවයේ පිහිටුවනු ලබන සේවකයින් ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවට හානියක් නොවන අයුරෙන් සුදුසු රැකියා තලවල පිහිටුවිය යුතු ය.

6. සේවයේ පිහිටුවනු ලබන සේවකයින්ට ගෙවනු ලබන හිඟ වැටුප් මත ඔවුන්ට හිමි සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාර අරමුදල් සහ පාරිතෝෂික දීමනා ආදී ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ හිමි විය යුතු ය.

7. ඉහත අංක 1 ප්‍රදානය ප්‍රකාරව සේවයේ පිහිටුවනු ලබන සේවකයින්ට සියලු පත්වීම් මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාසයක් ඇතුළත ලබා දී, සේවයේ පිහිටුවා ඒ බව මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට දැන්විය යුතු ය.

8. ඉහත අංක 2 සහ 3 ප්‍රදානයන් ප්‍රකාර ව සේවකයින්ට හිමි විය යුතු සියලු හිඟ වැටුප් මුදල් මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාස 03ක් ඇතුළත මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

9. මෙම ප්‍රදානය අමුණා ඇති එකී ලැයිස්තුවේ සඳහන් සේවකයින් 159 දෙනාට පමණක් ම සීමා විය යුතු ය.

**එස්. විරිතමුල්ල,**
බේරුම්කරු.

2020 පෙබරවාරි මස 29 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

### උපලේඛනය

1. පී. ඒ. එච්. එච්. පෙරේරා
2. එච්. එච්. ප්‍රනාන්දු
3. ඩබ්. එල්. අනුර
4. ජේ. එස්. එස්. ජයකොඩි
5. එම්. ඒ. කුසුමාවතී
6. යූ. කේ. කුසුමාවතී
7. එල්. එච්. අයි. කේ. ප්‍රනාන්දු
8. බී. ජී. ධර්මසේන
9. එම්. එස්. ප්‍රනාන්දු
10. එල්. බී. සිරිනන්දන
11. යූ. අයි. ලියනගේ
12. අයි. සුමනාවතී
13. ධම්මිකා ජයසිංහ
14. එච්. එස්. පී. පී. ප්‍රනාන්දු
15. ඩබ්. ඩී. සුනිල් සාන්ත
16. ඒ. ඒ. එස්. ඩබ්. බණ්ඩාර
17. ඩබ්. එම්. සී. දිසානායක
18. කේ. එච්. ඒ. ඒ. ආර්. කේ. පෙරේරා
19. පී. සුමතිපාල
20. එල්. ඒ. එස්. නානායක්කාර
21. කේ. පී. ඩී. ඥාණසිරි
22. එච්. ඒ. ජී. ප්‍රේමසිරි
23. ඩබ්. එම්. එන් ඩී. විජේරත්න
24. ඩබ්. ඒ. ආර්. සිසිර කුමාර
25. ආර්. ඒ. එස්. කරුණාතිලක
26. එස්. පී. ඩබ්. මල්ලිකා
27. ආර්. එල්. එස්. රාජපක්ෂ
28. පී. කමලපද්ම
29. එන්. පොඩිනිළමේ
30. ඩබ්. ජේ. පී. වීරක්කොඩි
31. එච්. පී. ආර්. පී. සුබසිංහ
32. ටී. ජී. සුගතදාස
33. එච්. එම්. ඒ. ප්‍රේමතිලක
34. ජේ. ඒ. ඒ. එල්. ජයකොඩි
35. ඩබ්. පී. එල්. වීරසිංහ
36. එම්. එච්. ඒ. ඒ. පී. පෙරේරා
37. ජී. කේ. ආර්. සේනාරත්න
38. ඒ. ඒ. එස්. එදිරිසිංහ
39. බී. ඒ. ඩී. ප්‍රසන්න
40. එම්. ජී. ප්‍රේමසිරි
41. අයි. එම්. නිමල්
42. ඩබ්. ඒ. ඩී. වනසිංහ
43. එච්. එම්. ජයවර්ධන
44. කේ. එන්. ධර්මසිරි
45. එච්. එන්. ප්‍රනාන්දු
46. ඩබ්. ඒ. සුනිල් ඉද්දමල්ගොඩ
47. පී. එම්. කේ. එල්. එම්. සමන්
48. ජී. ඩබ්. විමලරත්න
49. පී. වී. ජයරුක්
50. ඩබ්. එම්. ඒ. සිරිපාල
51. කේ. ඩී. ඒ. ඒ. එස් රාජරත්න
52. ජේ. ඒ. ඩී. එම්. ඒ. ජයසූරිය
53. ඒ. කේ. පී. සී. ජේ. කුමාර
54. එම්. එම්. ටී. ජේ. බණ්ඩාර
55. කේ. ජී. ඩී. කුමාර
56. එම්. එස්. පී. වික්‍රමසිංහ
57. කේ. වී. සුමිත්
58. කේ. ඒ. පී. ඉරෝෂිනි
59. යූ. එස්. එන්. පෙරේරා
60. ඩබ්. ජේ. ජේ. ආර්. සිල්වා
61. අයි. පී. එස්. ජයනාත්
62. එස්. ඒ. ඩී. රොහාන්ත
63. එස්. ඩබ්. අලුත්ගේ
64. ආර්. ටී. සඳමාලි
65. කේ. එම්. එස්. වී. බණ්ඩාර
66. ඩබ්. එස්. එම්. තාමෙල්
67. ඩබ්. ජී. ඒ. ප්‍රියන්ත
68. එම්. චමින්ද
69. පී. එච්. ප්‍රිතිලාල්
70. කේ. එම්. ජී. කැකුලන්දර
71. ඩබ්. එම්. එස්. ශාන්ත
72. එස්. ආර්. ඒ. කරුණාධීර
73. වයි. එම්. එම්. ජී. එල්. බණ්ඩා
74. පී. කේ. සී. විජේරත්න
75. ඩබ්. පී. ආර්. ඩබ්. රත්නායක
76. ආර්. ඩී. ජේ. ජයලත්
77. වයි. ජී. ඒ. කුමාර
78. කේ. වී. රංජිත්
79. එම්. එන්. කොස්තා
80. ඩී. කේ. ජී. එස්. ඒ. බණ්ඩාර
81. කේ. එම්. ජී. ඒ. එස්. කුමාර
82. කේ. බී. ඒ. ඩී. ආර්. රෝහණ
83. පී. ඒ. ප්‍රියන්ත
84. එච්. ජී. චන්ද්‍රසිරි
85. ජී. ඩබ්. සමන්ත
86. ඩබ්. ඒ. ඒ. එල්. රත්නකුමාර
87. කේ. ඒ. ඩී. පී. එල්. කුමාරපේලි
88. ඩබ්. එස්. අමින්ද
89. පී. ඒ. ජයවීර
90. එල්. ඩී. ජී. එල්. එස්. ජයලත්
91. ජී. කේ. ජී. ඒ. කේ. බණ්ඩාර
92. එම්. ආර්. ඒ. පී. ගුණවර්ධන
93. වයි. ඒ. ඩී. සී. එස්. කුමාර
94. ඒ. එම්. ආර්. එන්. අත්තනායක
95. පී. එච්. ඩී. ජයරත්න
96. බී. ඒ. ජී. තිසේරා
97. එච්. ඒ. ජයන්ත
98. වයි. පී. එස්. පතිරණ
99. එල්. බී. පී. පුෂ්පකුමාර
100. එම්. ජී. එස්. කුලරත්න
101. ආර්. එම්. කරුණාරත්න
102. බී. බී. ඒ. සී. පී. පෙරේරා
103. ඩී. පී. ඒ. එස්. කේ. ද සිල්වා
104. එච්. එම්. සෙනෙවිරත්න
105. ආර්. ඒ. සංජීව
106. එච්. එම්. ඩී. ඩී. බණ්ඩාර
107. ජී. ඩී. ඩී. ප්‍රියදර්ශන
108. කේ. බී. එස්. ප්‍රනාන්දු
109. ආර්. පී. එස්. විජේතුංග
110. පී. එස්. සිල්වා
111. එච්. එස්. ඕ. ප්‍රනාන්දු
112. ඩබ්. ඒ. ධර්මතිලක
113. ජී. ආර්. ජයවීර
114. එස්. බී. එම්. ආර්. වීරසිංහ
115. ජේ. එම්. රත්නපාල
116. ඩබ්. ඒ. ඩී. එන්. ගුණසේන

117. බී. ටී. අයි. කුමාරතුංග
118. ඊ. පී. සංජීව පෙරේරා
119. කේ. එස්. එස්. ප්‍රනාන්දු
120. ජේ. එච්. එම්. ඒ. ජයපද්ම
121. පී. ඩී. එස්. එස්. කුමාර
122. කේ. ඒ. කේ. ජේ. පෙරේරා
123. ආර්. පී. බී. ටී. පී. බුද්ධික
124. පී. ටී. එන්. ප්‍රනාන්දු
125. කේ. බී. එම්. කේ. බණ්ඩාර
126. ඩබ්. ඒ. ඒ. කුමාර
127. ජේ. කේ. ආර්. පී. ජයකොඩි
128. ආර්. ඩී. එස්. වසන්ත
129. බී. එම්. එන්. ජයසිරි
130. අයි. පී. එන්. සුසන්ත
131. ටී. ඒ. ජී. චින්තක
132. ඒ. බී. ආර්. පී. චන්ද්‍රකුමාර
133. බී. එම්. ටී. ප්‍රියදර්ශන
134. එල්. ඩී. එස්. කරුණාදාස
135. ඩබ්. ජී. එම්. සී. වර්ණසූරිය
136. කේ. එල්. එස්. පෙරේරා
137. කේ. ජී. ඩී. අර්. ජයරත්න
138. ඩී. ඩී. පී. රණතුංග
139. ටී. ඩබ්. ටී. කේ. සංජීව
140. එච්. ජී. ඩබ්. කලන්සූරිය
141. එච්. කේ. එන්. සී. ගුණරත්න
142. එස්. එම්. ඩබ්. එම්. දිසානායක
143. පී. එච්. ඒ. කුමාර
144. එම්. ඒ. ආර්. ආර්. පෙරේරා
145. පී. එම්. ජී. එස්. එස්. කුමාර
146. කේ. ඩී. වසන්ත
147. ජේ. එස්. ද සිල්වා
148. යූ. ඒ. එස්. පුෂ්පකුමාර
149. ආර්. එන්. බී. උඩගේ
150. එම්. ජී. නිමල්
151. එම්. ජේ. ගන්කන්ද
152. ඩබ්. කේ. පී. ආර්. ජයරත්න
153. එම්. ජී. පී. අයි. යූ. කේ. බණ්ඩාර
154. බී. එම්. ජේ. සී. බස්නායක
155. එල්. එස්. එච්. සඳරුවන්
156. ඩබ්. සුනන්ද සිල්වා
157. ඩබ්. කේ. අජිත්
158. එම්. සී. ජානක
159. අයි. කේ. ප්‍රියන්ත

08 - 541

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.